වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

Annual Performance Report

2021





සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

கால்நடை உற்பத்தி சுகாதாரம் திணைக்களம்

Department of Animal Production and Health

වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்திர செயலாற்றுகை அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2021

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

கால்நடை உற்பத்தி சுகாதாரத் திணைக்களம

Department of Animal Production and Health

Peradeniya

SriLanka

Tel: 94-081-2388337/2388462

Fax: 94-081-2388619

Web Site: www.daph.gov.lk

පටුන

පිටු අංකය

1. ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම 01
1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 01
1.3. ප්‍රධාන කාර්යයන් 02
1.4. සංවිධාන සටහන 04
1.5. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 07
1.6. දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ යටතේ පවතින ආයතන 07
1.7. විදේශාධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 07

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය 08
2.2. 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් සහ ව්‍යාපෘති 14
2.3. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති 16

3. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 18
3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 19
3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 20
3.4. මූල්‍ය ප්‍රකාශ සටහන් 21
3.5. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 22
3.6. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 23
3.7. විගණකාධිපතිවරයාගේ වාර්තාව 24

4. කාර්යසාධන දර්ශක

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 39

5. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1. හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 39
5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 39

6. මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය 40
6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය/අතිරික්තය බලපා ඇති ආකාරය 40
6.3. මානව සම්පත් සංවර්ධනය 41

7. අනුකූලතා වාර්තාව 43

2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය - 292

1. ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

1978 වර්ෂයේදී ස්ථාපිත කරනු ලැබූ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ පශු සම්පත් සංවර්ධනය පිළිබඳව වගකීම දරණ ප්‍රධාන රජයේ ආයතනය වන අතර එය කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින, පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. එමෙන්ම මෙම දෙපාර්තමේන්තුව රට තුළ සත්ත්ව රෝග පැතිරීම වළක්වාලීම, මැඩපැවැත්වීම, පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු, තාක්ෂණික නායකත්වය සැපයීම සහ සත්ත්ව අභිජනන කටයුතු සඳහා විශේෂඥ උපදෙස් හා සහාය සේවාවන් සැපයීම සම්බන්ධව නීත්‍යානුකූල බලය පැවරී ඇති ජාතික ආයතනයද වේ. මුළු දිවයිනම ආවරණය වන පරිදි සිදුකරනු ලබන වෙනත් ප්‍රධාන කටයුතු අතර සත්ත්ව පාලනය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම, එම කර්මාන්තය නගාසිටුවීමට අදාළ ව්‍යාපෘති සැකසීම, ආර්ථික ඇගයීම් සහ විශේෂ සංවර්ධන වැඩසටහන්ද ඇතුළත්වේ. පශු සම්පත් ක්ෂේත්‍රයේ සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් අදාළ නීති සම්පාදනය කර ක්‍රියාත්මක කරනු ලැබේ. පළාත් සභා පිහිටුවීමත් සමඟ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර මට්ටමේ කටයුතු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු නවය (09) වෙතට පැවරිණි.

ජාතික සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් තාක්ෂණ නායකත්වය, විශේෂඥ සේවා සහ සහාය සේවා, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු වෙත ලබාදීමෙන් පශු සම්පත් කර්මාන්තය වෙනුවෙන් විශාල මෙහෙයක් ඉටුකරනු ලබයි. පශු වෛද්‍ය නිලධාරීන් විසින් මෙහෙයවනු ලබන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාකාරී ඒකකයන්ය. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක වන දිවයිනේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම පාහේ පිහිටුවා තිබෙන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල 337 මඟින් බිම් මට්ටමේ සිට සියළුම පශු සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.2.1. දැක්ම

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා පශු සම්පත් ක්ෂේත්‍රය මෙහෙයවන ප්‍රමුඛතම ආයතනය වීම.

1.2.2. මෙහෙවර

නිරෝගීමත් සත්ත්ව ගහනයකින් හා ඉහළ නිෂ්පාදන ඵලදායිතාවයකින් යුක්තව ආහාර සුරක්ෂිතතාවයට දායකවීමෙන් හා ආහාරවල සෞඛ්‍යාරක්ෂිතභාවයද තහවුරු කරමින් පශු සම්පත් ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනයක් අත්පත්කර ගැනීම සඳහා තාක්ෂණික මගපෙන්වීම හා සහාය ලබාදීම.

1.2.3. අරමුණු

- සත්ත්ව රෝග වලක්වාලන සහ මර්දනය කරන කාර්යක්ෂම සත්ත්ව සෞඛ්‍ය සේවාවක් සහතික කිරීම.
- සත්ත්ව ජාන සම්පත් ප්‍රශස්ත මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම ප්‍රවලිත කිරීම.
- ගුණාත්මක සත්ත්ව ආහාර සහ ආහාර සම්පත් ප්‍රයෝජනයට ගැනීම ප්‍රවලිත කිරීම.
- සත්ත්ව ආහාර කර්මාන්තයේ වර්ධනය සහ සංවර්ධනය ප්‍රවලිත කිරීම.
- තිරසාර පශු සම්පත් සංවර්ධනයක් උදෙසා පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් පවත්වාගෙන යාම.
- පශු එන්නත්සාර සහ අනෙකුත් පශු ජෛවීය ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
- පශු සම්පත් ක්ෂේත්‍රයට අදාල පරීක්ෂණාගාර සේවා සම්මත පරීක්ෂණාගාර තුලදී ඉටුකර දීම.
- පශු සම්පත් ක්ෂේත්‍රයට අදාල පනත් සහ රෙගුලාසි අවශ්‍ය විටදී සංශෝධනය කිරීම, ඒ සඳහා උපදෙස් ලබාදීම හා නිරීක්ෂණය කිරීම.
- තාක්ෂණිකව සවිබල ගැන්වූ මානව සම්පත් සංවර්ධනය.
- කාර්යක්ෂමව හා ඵලදායි ලෙස තොරතුරු බෙදාහැරීම සහ තාක්ෂණික සේවා සැපයීම තහවුරු කිරීම.
- ව්‍යාපෘති හා වැඩසටහන් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ ඇගයීම.
- සත්ත්ව නිෂ්පාදනවල ආරක්ෂිතභාවය තහවුරු කිරීම.
- විධිමත් සත්ත්ව පාලන ක්‍රම ප්‍රවර්ධනය කිරීම සහ ඊට අදාළව පහසුකම් සැපයීම.
- සතුන්ගේ සුභසාධනය සහ යහපැවැත්ම තහවුරු කිරීම.
- දෙපාර්තමේන්තු කාර්යයන් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම.

1.3. ප්‍රධාන කාර්යයන්

- ඉහළ නිෂ්පාදන හැකියාවක් සහිත උසස් ආරයේ ගව හා එළු ශුක්‍ර නිෂ්පාදනය කිරීම ඇතුළු ජානික කෘතිම සිංචන වැඩසටහන මෙහෙයවීම
- අභිජනන කටයුතු සඳහා සතුන්ගේ පෙළපත හා කාර්යසාධන වාර්තාකරණය
- සත්ත්ව ජාන සම්පත් ආරක්ෂණය
- එළුවන්ගේ ආරය නැංවීම
- වැස්සි පැටවුන් ඇතිදැඩි කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- පෝෂ තෘණ හා සයිලේජ් නිෂ්පාදනය සහ තෘණ අලෙවිකරණය ප්‍රවලිත කිරීම

- රෝග වැලැක්වීමේ එන්නත්කරණ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- දේශීයව එන්නත්සාර (කුර හා මුඛ, කාලගාත්‍රා, ගව රක්තාශ්‍රව, රැනිකට්) සහ අනෙකුත් ජෛවීය ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම
- බුරුළු ප්‍රදාහය වැලැක්වීම, සුව කිරීම සහ බුරුළු නික්ෂේපන නිෂ්පාදනය
- සැල්මොනෙල්ලෝසිස් හා රැනිකට් රෝග පාලනය
- අති ව්‍යාධිජනක කුරුළු උණ රෝගයට එරෙහිව කාර්යක්ෂම පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් ඇති කිරීම
- සත්ත්ව රෝග හඳුනාගැනීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා පශු විමර්ශන මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම
- කිරි ගොවිපොළවල සෞඛ්‍ය මට්ටම ඉහළ නැංවීම
- පරීක්ෂණාගාර පහසුකම් ඉහළ නැංවීම සහ අවශ්‍යතාවයන් සැපිරීම
- කිරි තාක්ෂණ පරීක්ෂණාගාර පහසුකම් හා යටිතල පහසුකම් ඉහළ නැංවීම
- පශු සම්පත් ක්ෂේත්‍රය සඳහා විශ්ලේෂණ සහ උපදේශන සේවා සැපයීම
- ක්ෂේත්‍ර මට්ටමේ සතුන් හඳුනාගැනීමේ කටයුතු සිදුකිරීම
- දේශීය වෙළෙඳපොළ තුළ උසස් තත්ත්වයේ සත්ව ආහාර සුලභ කිරීම තහවුරු කිරීම
- පශු නිෂ්පාදන හා ජෛවී ද්‍රව්‍ය නියාමනය
- කුකුළු පාලනයට අදාළ නියාමන කටයුතු
- සත්ත්ව නිරෝධායන හා ආවේක්ෂණ කටයුතු
- අන්තර්ජාතික වෙළඳාම් පහසුකරණය
- නිරෝධායන ඒකකවල යටිතල පහසුකම් ඉහළ නැංවීම සහ පරීක්ෂණාගාර පහසුකම් ඉහළ නැංවීම
- පශු සම්පත් පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- පශු සම්පත් ඩිප්ලෝමාධාරීන් බිහිකිරීම සඳහා සත්ත්ව පාලන විද්‍යාල (කරඳගොල්ල/ සීප්පුකුලම) පවත්වාගෙන යාම
- සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අඛණ්ඩ අධ්‍යාපන ආයතනයේ පුහුණු හා අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම
- ඉලෙක්ට්‍රොනික්, මුද්‍රිත මාධ්‍ය හා ප්‍රදර්ශන මගින් තොරතුරු බෙදාහැරීම
- ආදර්ශ ගොවිපොළ ඒකක ප්‍රදර්ශන
- පශු තාක්ෂණ උද්‍යානයේ විවිධ ගොවිපොළ ඒකක සංවර්ධනය හා නඩත්තු කිරීම
- පශු සම්පත් ක්ෂේත්‍රයේ සමාජ ආර්ථික බලපෑම පිළිබඳ අධ්‍යයනයන් සිදුකිරීම
- පශු සම්පත් සංඛ්‍යාන ප්‍රකාශන සැකසීම හා බෙදාහැරීම
- පශු වෛද්‍ය සේවාව පුළුල් කිරීම සඳහා පශු වෛද්‍ය කාර්යාල ස්ථාපනය

1.4. සංවිධාන සටහන



Other Staff: BA , DO, DA, Le.Ass, Pro.Ass., Pro.Ass.Com, TO, Drftm, RA, PMA, LIB, LDO, WR
Dri, Tra.Ope., LA, Mech, BO, Car, Elec, Ban.Kee, Watc, CatC, MM, GtC, AnC, Grs, O.E.S, Liv.Ass, GL, SL, FA

DG - අධ්‍යක්ෂ ජනරාල්
ADG - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
D/AD - අධ්‍යක්ෂ, පරිපාලන
D/VRA - අධ්‍යක්ෂ, පශු අණපනත් හා නීති
D/LPE - අධ්‍යක්ෂ, පශු සම්පත් සැලසුම් හා ආර්ථික
D/HRD - අධ්‍යක්ෂ, මානව සම්පත් සංවර්ධන
D/AB - අධ්‍යක්ෂ, සත්ත්ව අභිජනන
D/VR - අධ්‍යක්ෂ, පශු පර්යේෂණ
D/AH - අධ්‍යක්ෂ, සත්ත්ව සෞඛ්‍ය
CA - ප්‍රධාන ගණකාධිකාරී
CLE - ප්‍රධාන පශු ආර්ථික විශේෂඥ
CE - ප්‍රධාන වසංගතවේදී
VPH.Sp. - පශු මහජන සෞඛ්‍ය විශේෂඥ
P.Sc - ප්‍රධාන විද්‍යාඥ
DE.Sp. - කිරිගව ඉංජිනේරු විශේෂඥ
Vet.In.Sp. - පශු විමර්ෂණ විශේෂඥ
C.Vac - ප්‍රධාන එන්නත්වේදී
R/AF - ලේඛකාධිකාරී (සත්ත්ව ආහාර)
R/VD - ලේඛකාධිකාරී (පශු ඖෂධ)
CAQO - ප්‍රධාන සත්ත්ව නිරෝධායන නිලධාරී
AB.Sp. - සත්ත්ව අභිජනන විශේෂඥ
VR.Sp. - පශු ප්‍රජනන විශේෂඥ
C.Agro. - ප්‍රධාන ශස්‍යවේදී

CIA - ප්‍රධාන අභ්‍යන්තර විගණක
Acct. - ගණකාධිකාරී
DD/AH - නියෝජ්‍ය අධ්‍යක්ෂ, සත්ත්ව සෞඛ්‍ය
DD/VR - නියෝජ්‍ය අධ්‍යක්ෂ, පශු පර්යේෂණ
DD/R - නියෝජ්‍ය අධ්‍යක්ෂ, පර්යේෂණ
DD/TS - නියෝජ්‍ය අධ්‍යක්ෂ, තාක්ෂණ සේවය
DD/LPE - නියෝජ්‍ය අධ්‍යක්ෂ, පශු සම්පත් සැලසුම් හා ආර්ථික
DD/HRD - නියෝජ්‍ය අධ්‍යක්ෂ, මානව සම්පත් සංවර්ධන
DD/AB - නියෝජ්‍ය අධ්‍යක්ෂ, සත්ත්ව අභිජනන
DD/DD - නියෝජ්‍ය අධ්‍යක්ෂ, කිරිගව සංවර්ධන
LE - පශු ආර්ථික විශේෂඥ
AD.Ad - සහකාර අධ්‍යක්ෂ/ පරිපාලන
SVP - එන්නත්සාර අධිකාරී
AQO - සත්ත්ව නිරෝධායන නිලධාරී
VRO - පශු පර්යේෂණ නිලධාරී
VIO - පශු විමර්ශණ නිලධාරී
VS - පශු වෛද්‍ය නිලධාරී
LO - සත්ත්ව පාලන නිලධාරී
RO - පර්යේෂණ නිලධාරී
Leo - නීති නිලධාරී
Eng. - සිවිල් ඉංජිනේරු
AO - පරිපාලන නිළධාරී

RA/S - පර්යේෂණ සහකාර /විශේෂ ශ්‍රේණිය
LPO - පශු සම්පත් ප්‍රවර්ධන නිලධාරි
Trl - භාෂා පරිවර්තක
I & CTO - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි
SO - සංඛ්‍යාලේඛණ නිලධාරි

අනෙකුත් කාර්ය මණ්ඩලය

BA - අයවැය සහකාර
DO - සංවර්ධන නිලධාරි
DA - සංවර්ධන සහකාර
Le.Ass - නීති සහකාර
Pro.Ass. - වැඩසටහන් සහකාර
Pro.Ass.Com - වැඩසටහන් සහකාර (සන්නිවේදන)
TO - තාක්ෂණ නිලධාරී
Drftm - සැලසුම් ශිල්පී
RA - පර්යේෂණ සහකාර
PMA - රාජ්‍ය කළමණාකරණ සහකාර
LIB - පුස්තකාලයාධිපති
LDO - පශු සම්පත් සංවර්ධන නිලධාරි
Dri - රියදුරු
Tra.Ope. - ට්‍රැක්ටර් ක්‍රියාකරු
LA - රසායනාගාර සහායක
Mech - යාන්ත්‍රික ශිල්පී
WR - නේවාසිකාගාර පාලක

BO - බොයිලේරුකරු
Car - වඩුකරු
Elec - විදුලි ශිල්පී
Ban.Kee. - බංගලා භාරකරු
Watc - මුරකරු
CatC - පට්ටිගොනුන් රැකබලාගන්නා
MM - කිරිකරු
GtC - එළුවන් රැකබලාගන්නා
AnC - සත්ත්ව රැකවල්කරු
Grs - තණකොළ කපන්නා
O.E.S. - කාර්යාල කාර්යය සහයක
Liv.Ass - සත්ත්ව පාලන සහයක
GL - උද්‍යාන කම්කරු
SL - සනීපාරක්ෂක කම්කරු
FA - ක්ෂේත්‍ර සහායක

1.5. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- සත්ත්ව අභිජනන අංශය
- සත්ත්ව සෞඛ්‍ය අංශය
- පශු අණුපනත් හා නීති අංශය
- පශු සම්පත් සැලසුම් හා ආර්ථික අංශය
- මානව සම්පත් සංවර්ධන අංශය
- පශු පර්යේෂණ ආයතනය
- මුදල් අංශය
- පරිපාලන අංශය

1.6. දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ යටතේ පවතින ආයතන

- සත්ත්ව අභිජනන අංශය
  කෘත්‍රිම සිංචන මධ්‍යස්ථාන (කුණ්ඩසාලේ, පොළොන්නරුව)
  එළු අභිජනන මධ්‍යස්ථාන (තෙලහැර, ඉඹුලන්දණ්ඩ)

- සත්ත්ව සෞඛ්‍ය අංශය
  පශු විමර්ශණ මධ්‍යස්ථාන (25)

- පශු අණුපනත් හා නීති අංශය
  සත්ත්ව නිරෝධායන මධ්‍යස්ථාන (කොළඹ, කටුනායක, මත්තල, යාපනය)

- මානව සම්පත් සංවර්ධන අංශය
  සත්ත්ව පාලන විද්‍යාල (කරදගොල්ල, සීප්පුකුලම)
  අඛණ්ඩ අධ්‍යාපන ආයතනය- ගන්නෝරුව
  පශු තාක්ෂණ උද්‍යානය- ගන්නෝරුව

- පශු පර්යේෂණ ආයතනය
  මධ්‍යම කුකුළු පර්යේෂණ මධ්‍යස්ථානය - කරදගොල්ල
  සත්ව විෂාණු රසායනාගාරය- පොල්ගොල්ල
  කිරි තාක්ෂණ රසායනාගාරය- ගන්නෝරුව

1.7. විදේශාධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

2021 වර්ෂය තුළදී විදේශාධාර ලබන ව්‍යාපෘති කිසිවක් ක්‍රියාත්මක නොවීය.

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2021 වර්ෂය තුළදී සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය (දෙසැම්බර් 31 දිනට)

අනු අංකය	*වැඩසටහන / ව්‍යාපෘතිය*	*2021 අයවැය ප්‍රතිපාදන (රු.මී)*	*භෞතික ප්‍රගතිය (%)*	*මූල්‍ය ප්‍රගතිය (රු.මී.)*	*විශේෂ කරුණු*
1.	සතුන්ගේ බෝවන රෝග වැලැක්වීමේ වැඩසටහන	28.00	44	14.91	එන්නත් ආනයනය සඳහා ප්‍රතිපාදන නොලැබීම, පැවති කොවිඩ්- 19 වසංගත තත්වය නිසා ක්ෂේත්‍ර එන්නත්කරණ කටයුතු අඩාල විම.
2.	පශු සම්පත් පර්යේෂණ වැඩසටහන	50.00	90	44.72	
3.	සත්ත්ව අභිජනන ව්‍යාපෘතිය	135.00	77.2	125.72	
4.	වැස්සි පැටවුන් ඇතිදැඩි කිරීමේ ව්‍යාපෘතිය	50.00	76	44.59	
5.	පශු වෛද්‍ය කාර්යාලවල සේවා සැපයුම් පද්ධතිය වැඩිදියුණු කිරීම	22.00	85	10.79	
6.	කුර හා මුඛ රෝග එන්නත දේශීයව නිෂ්පාදනය	20.00	94	10.37	
7.	සතුන් හඳුනාගැනීමේ වැඩසටහන	5.00	60	3.37	
8.	සත්ත්ව නිරෝධායන ඒකක පුළුල් කිරීම හා නවීකරණය	4.00	50	2.99	පැවති කොවිඩ්- 19 වසංගත තත්වය නිසා රට වසා තැබීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු 2022 වසර සඳහා කල් දැම්මට සිදුවිම.
9.	කුකුළු සෞඛ්‍ය කළමනාකරණය මඟින් කුකුළු මස් සහ බිත්තර අපනයනයට පහසුකම් සැලසීම	7.00	83	3.93	
10.	බුරුළු ප්‍රදාහ පාලන වැඩසටහන	15.00	49	8.28	පැවති කොවිඩ්- 19 වසංගත තත්වය නිසා එන්නත් නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීමට නොහැකි වීම නිසා නිෂ්පාදනය සිදුකළ නොහැකි විම
11.	උසස් තත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම	70.00	72	26.95	
12.	වනජීවී රෝග ආවේක්ෂණ වැඩසටහන	10.00	67	3.67	
13.	පශු විමර්ෂණ මධ්‍යස්ථාන වල කුකුළු හා මත්ස්‍ය රෝග හඳුනාගැනීමේ හා ආවේක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම	15.00	56	1.67	
14.	ආහාර ආරක්ෂණය හා අපනයන කටයුතු සඳහා පහසුකරණය සඳහා සත්ව ආහාර හා පශු නිෂ්පාදන වල ගුණාත්මකභාවය සහතික කිරීම	23.00	62.3	20.6	
15.	සත්ව පාලන ඩිප්ලෝමාධාරීන් බිහි කිරීමේ හැකියාව ශක්තිමත් කිරීම	35.00	62	19.38	
16.	සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන	5.00	80	4.85	
17.	තත්ත්ව ආරක්ෂණ වැඩසටහන		83		
18.	පශු සම්පත ප්‍රවලිත කිරීමේ වැඩසටහන		100		
19.	පොත් හා වාර ප්‍රකාශන		100		
එකතුව		*494*		*346.79*	

2.1. 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

2.1.1. පශු සම්පත් සංවර්ධනය

2.1.1.1. කිරි ගව ක්ෂේත්‍රය

අ. සතුන්ගේ ආරය වැඩිදියුණු කිරීම සහ සතුන් අභිජනනය

රට තුළ කිරි නිෂ්පාදනය වැඩිකිරීම උදෙසා දේශීය එළ ගව සහ මී ගව ගහනය ගුණාත්මකව වැඩිකර ගැනීමට උසස් ආරයේ ගව ශුක්‍ර භාවිතා කර කෘත්‍රිම සිංචන කටයුතු ක්‍රියාත්මක කිරීම ප්‍රධාන සත්ත්ව අභිජනන වැඩසටහන වේ. ශුක්‍ර නිෂ්පාදනය කර බෙදාහැරීම, කෘත්‍රිම සිංචන ශිල්පීන් පුහුණු කිරීම, තෘණ හා පෝෂ තෘණ වර්ග හඳුන්වාදීම හා සංවර්ධනය සහ තෘණ වගාව පිළිබඳ පුහුණුව මෙම වැඩසටහනේ ප්‍රධාන ක්‍රියාකාරකම් විය.

සමාලෝචිත කාල සීමාව තුළදී සත්ත්ව අභිජනන වැඩසටහනේ ප්‍රගතිය	
කුණ්ඩසාලේ සහ පොළොන්නරුවේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථාන මගින් නිෂ්පාදිත ශුක්‍ර වඩි ප්‍රමාණය	*213,481*
ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල මගින් සිදුකළ කෘත්‍රිම සිංචන සංඛ්‍යාව	*200,795*
කෘත්‍රිම සිංචනය කරන ලද එළදෙනුන් / වැස්සියන් සඳහා ගැබ් පරීක්ෂාවන් (ක්ෂේත්‍රයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින්)	*63,607*
වාර්තා වී ඇති පැටව් උපත් සංඛ්‍යාව	*59,601*

ආ. වැස්සි පැටවුන් ඇතිදැඩි කිරීමේ වැඩසටහන

කෘත්‍රිම සිංචනයේ සැබෑ ප්‍රතිලාභ අත්කර ගැනීමට මෙන්ම ජාතික කිරි නිෂ්පාදනය වැඩිකිරීමට කෘත්‍රිම සිංචන සේවය මගින් උපත ලැබූ වැස්සි පැටවුන් නියමිත පරිදි රැකබලා ගැනීම ගොවිපොළ මට්ටමේදී බලපාන ප්‍රධාන ගැටළුවයි. රට තුළ අභිජනනයට සුදුසු වැස්සියන්ගේ ගහනය වැඩිකිරීමටද එමගින් දේශීය කිරි නිෂ්පාදනය නංවාලීමට තුඩු දෙන පරිදි කෘත්‍රිම සිංචනය මගින් උපන් වැස්සි පැටවුන් ලියාපදිංචි කර තාක්ෂණික උපදෙස් සේවාවන් සහ අවශ්‍ය යෙදවුම් සඳහා සහනාධාර ගෙවීමේ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වේ. සමාලෝචිත කාල සීමාව තුළදී වැස්සි පැටවුන් 13,804 ක් ලියාපදිංචි කර ඇත.

2.1.1.2. එළු ක්ෂේත්‍රය

උසස් ආරයේ අභිජනන එළුවන් සඳහා පවතින ඉල්ලුමට සරිලන ලෙස ඉඹුලන්දණ්ඩ සහ තෙලහැර පිහිටි එළු අභිජනන ගොවිපොළවල් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලැබේ. මෙම කාලය තුළදී නිෂ්පාදනය සහ ඵලදායිතාවය වැඩිකර ගැනීම උදෙසා එළු පාලනයේ නිරත ගොවීන්ට අභිජනන කටයුතු සඳහා ජමුනාපාරි පිරිමි එළුවන් 105 ක් හා ගැහැණු එළුවන් 05 දෙනෙකු ලබා දී ඇති අතර අභිජනන කටයුතු සඳහා ශුක්‍ර දායක එළුවන් ලෙස බෝයර් පිරිමි එළුවන් 14 දෙනෙකු ලබා දී තිබේ. තවද, එළු ගහනය වැඩිකිරීම උදෙසා 2021 දෙසැම්බර් මාසය වනවිට ක්ෂේත්‍ර මට්ටමින් කෘත්‍රිම සිංචනයන් 4,431ක්ද සිදුකර තිබේ.

2.1.1.3. කුකුළු ක්ෂේත්‍රය

මෙරට කුකුළු කර්මාන්තය තුළ පෞද්ගලික අංශය සිදුකරනු ලබන කාර්යයන් හා සැසඳූ විට රාජ්‍ය අංශයේ කාර්යභාරය, නීති සහ තත්ත්ව සහතික කිරීමට පමණක් සීමාවී ඇත.

විදේශ රටවල කුරුළු උණ ව්‍යාප්ත වීම හේතුවෙන් මව්පිය සහ මුතුන් මිත්තන්ගේ පරම්පරාවලට අයත් සතුන් මෙරටට ආනයනය කිරීමේදී සීමාවන් පනවා එම රෝග මෙරටට සංක්‍රමණය වීම වැලැක්වීමට ගුවන් තොටුපල හා වරායන්හි පිහිටුවා ඇති සත්ත්ව නිරෝධායන කාර්යාල මගින් රෝග වලක්වාලීමේ විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

බ්‍රොයිලර් මාපිය සතුන්ගේ අවශ්‍යතාවය දේශීය නිෂ්පාදනය මගින් හා ආනයනය මගින් සපුරා ගැනේ. වර්තමානයේ බ්‍රොයිලර් මාපිය සතුන්ගේ අවශ්‍යතාවයෙන් 82.47% ක් මෙරට බ්‍රොයිලර් මුතුන් මිත්තන් ඇති කරන ගොවිපොළ 03 ක් මගින් නිපදවනු ලබයි. 2021 දෙසැම්බර් මාසය වනවිට ප්‍රගතිය පහත පරිදි වේ.

දේශීය නිෂ්පාදනය - බ්‍රොයිලර් මාපිය පරම්පරාවට අයත් සතුන්	*1,246,995*
ආනයනය - බ්‍රොයිලර් මුතුන් මිත්තන්ගේ පරම්පරාවලට අයත් සතුන්	*30,052*
- බ්‍රොයිලර් මාපිය පරම්පරාවට අයත් සතුන්	*264,914*
- ලේයර් මාපිය පරම්පරාවට අයත් සතුන්	*91,829*

අභිජනන ගොවිපොළ මගින් මෙම කාලය තුළදී බ්‍රොයිලර් පැටවුන් මිලියන 175.22 ක් ද බිත්තර දමන කිකිළි පැටවුන් මිලියන 10.05 ක් ද නිෂ්පාදනය කරනු ලැබ ඇත. එසේම කුඩා පරිමාණ කුකුළු පාලන ගොවීන්ට නොමිලේ බෙදාදීම සඳහා පශු පර්යේෂණ ආයතනය විසින් රැනිකට් රෝගය සඳහා එන්නත් නිපදවනු ලැබේ. සමාලෝචිත කාල සීමාව තුළදී රැනිකට් එන්නත් සාර වඩි 7,420,400 ක් නිෂ්පාදනය කර ඇති අතර කුකුළන් 2,746,589 ක් සඳහා රැනිකට් එන්නත ලබාදී ඇත.

2.1.2. සත්ත්ව සෞඛ්‍යය වැඩිදියුණු කිරීම

අ. සතුන්ගේ බෝවන රෝග මැඩලීම

නිෂ්පාදනය සහ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා සෞඛ්‍ය සම්පන්න සත්ත්ව ගහනයක් පවත්වාගෙන යාමට මුළු දිවයින පුරා සාර්ථක අයුරින් රෝග වැලැක්වීම හා මර්දනය කිරීම පිණිස වන සත්ත්ව සෞඛ්‍ය සේවාවක් ලබාදීම උපරිම වැදගත්කමකින් යුතු වූවකි. ශ්‍රී ලංකාවේ බෝවන සත්ත්ව රෝග පැතිරීම වැලැක්වීම සඳහා එන්නත් කිරීම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු සමඟ එක්වී ක්‍රියාත්මක කරන ලදී.

ප්‍රතිශක්තිකරණ වැඩසටහන සඳහා අවශ්‍ය වන කුර හා මුඛ, රක්තාශ්‍රව, කාලගාත්‍රා සහ බෘසෙල්ලා එන්නත් පශු පර්යේෂණ ආයතනය මගින් නිෂ්පාදනය කරන ලදී. සමාලෝචිත කාල සීමාව තුළදී ප්‍රතිශක්තිකරණ වැඩසටහන යටතේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් නිෂ්පාදනය කරන ලද එන්නත් සහ ප්‍රතිශක්තිකරණය ලබා දුන් සතුන් ගණන පිළිබඳ විස්තර පහත පරිදි වේ.

එන්නත් වර්ගය	*නිෂ්පාදනය කරන ලද එන්නත් වඩි ප්‍රමාණය*	*ප්‍රතිශක්තිකරණය ලබා දුන් සතුන් ගණන*
කුර සහ මුඛ රෝග	*249,320*	*536,030*
රක්තාශ්‍රව රෝග	*166,320*	*130,585*
කාලගාත්‍රා	*150,645*	*96,428*
බෑසෙල්ලා	*6,050*	*3,298*

ආ. කුරුළු උණ මෙරටට ඇතුළුවීම වැලැක්වීම

ආසියාවේ රටවල් කිහිපයක ආර්ථිකයට බලපෑ අතිව්‍යාධිජනක කුරුළු උණ රෝගයෙන් තොර රටක් ලෙස පැවතීමට ශ්‍රී ලංකාවට මේ දක්වා හැකියාව ලැබී ඇත. මෙරටට කුරුළු උණ ඇතුළුවුවහොත් එම රෝගය මැඩපවත්වා තුරන් කිරීමට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් විධිමත් සැලැස්මක් සූදානම් කර ඇති අතර, මේ සම්බන්ධයෙන් රෝග ආවේක්ෂණ වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.

පශු පර්යේෂණ ආයතනය සතු රෝග විනිශ්චය කිරීමේ පහසුකම් පුළුල් කරනු ලැබිණ. ජාතික සහ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු නිලධාරීන්ට අතිව්‍යාධිජනක කුරුළු උණ රෝගය වැලැක්වීමට සහ මැඩලීමට සම්බන්ධ පුහුණුවීම් ලබා දී ඇත.

මෙම අතිව්‍යාධිජනක කුරුළු උණ විමර්ශන වැඩසටහන යටතේ, ක්ෂේත්‍රයෙන් ලබාගත් සාම්පල 21,082 ක් මෙම කාලය තුළදී පරීක්ෂාවට භාජනය කරනු ලැබ ඇති අතර, ඒවා රෝගයෙන් තොර බවට තීරණය කෙරිණි.

ඇ. සත්ත්ව නිරෝධායන සහ පරීක්ෂා කිරීමේ සේවාව ශක්තිමත් කිරීම

මෙරටට යම්කිසි ආගන්තුක (විදේශීය) සත්ත්ව රෝගයක් ඇතුළුවීමට එරෙහිව ඇති පළමු ඉදිරි ආරක්ෂක ක්‍රමය සත්ත්ව නිරෝධායන සේවාවයි. අභිජනන කුකුළන් ආනයනය කිරීමෙන් පසු නිරෝධායනය කිරීමට හා අපනයන වෙළෙඳපොළ සඳහා වන විසිතුරු මත්ස්‍ය කර්මාන්තය සෞඛ්‍යාරක්ෂිතව ගුණාත්මක බවින් නගාසිටුවීමේ අරමුණින් යුතුව මෙම ව්‍යාපෘතිය 2008 දී ආරම්භ කරන ලදී.

සමාලෝචිත කාල සීමාව තුළදී මෙම වැඩසටහන යටතේ ආනයනය කළ දිනක් වයසැති කුකුළු පැටවුන් කණ්ඩායම් 50 ක් නිරෝධායන පරීක්ෂාවට භාජනය කරන ලදී. මීට අමතරව, මත්ස්‍ය ගොවිපොළවල් 39 ක්ද පරීක්ෂාවට ලක් කරන ලදී.

ඈ. උසස් තත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම

2018 වසරේදී ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය මගින් උසස් තත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම තවදුරටත් පුළුල් කිරීම සිදු කෙරේ. දැනට නිෂ්පාදනය කරන එන්නත් වල තත්වය වැඩිදියුණු කිරීමත්, නව එන්නත් අළුතෙන් නිෂ්පාදනයත් අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ 2021 වසරේදී කුර හා මුඛ, රක්තාශ්‍රව, කාලගාත්‍රා, බෑසෙල්ලා සහ රැනිකට් එන්නත් නිපදවීමට අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කර ඇත.

ඉ. පශු විමර්ෂණ මධ්‍යස්ථානවල කුකුළු හා මත්ස්‍ය රෝග හඳුනාගැනීමේ හා ආවේක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම

මෙම ව්‍යාපෘතිය මගින් හඳුනාගත් පශු විමර්ෂණ මධ්‍යස්ථාන වල කුකුළු හා මත්ස්‍ය රෝග හඳුනාගැනීමේ හා ආවේක්ෂණ කටයුතු ප්‍රාදේශීයව සිදුකිරීම සඳහා පරීක්ෂණාගාර නවීකරණය, පරීක්ෂණාගාර උපකරණ හා රසායනික ද්‍රව්‍ය සපයා දීම, පරීක්ෂණාගාර සේවකයන්ගේ කුසලතා සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාක්මක කිරීම ආදී කටයුතු සිදු කරනු ලැබේ. 2021 වර්ෂයේදී ද මෙම කාර්යයන් අඛණ්ඩව සිදු කරගෙන යාමට හැකි විය.

2.1.3. මානව සම්පත් සංවර්ධනය

අ. හැකියා වර්ධනය, අධ්‍යාපනය සහ පුහුණුව

දෙපාර්තමේන්තුව විසින් නවීන ප්‍රායෝගික සත්ත්ව පාලන කටයුතු සම්බන්ධයෙන් තාක්ෂණික නිලධාරීන් සහ ගොවීන්ට හැකියා වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. සමාලෝචිත කාල සීමාව තුළදී කොරෝනා වසංගත තත්වය හේතුවෙන් දියර කිරි නිෂ්පාදනය හා සම්බන්ධ පුහුණු වැඩසටහන් 05 ක් සීප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලයේදී පවත්වා ඇති අතර ගොවීන් 93 ක් සඳහා පුහුණුව ලබාදී ඇත.

අනුරාධපුර හෙද පුහුණු පාසලේ හෙද සිසුවියන් සඳහා සත්ත්ව පාලනයේ මූලික කරුණු පිළිබඳ එක්දින පුහුණු වැඩසටහනක් සිදුකළ අතර ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ සිසුන් සඳහා සත්ත්ව පාලනය පිළිබඳ 5 දින පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. ජාතික ශ්‍රම බලකායේ පුහුණුව ලබන පුද්ගලයන් 150 ක් සඳහා ද සත්ත්ව පාලනය පිළිබඳ පුහුණු වැඩසටහනක් සිදු කරන ලදී.

මෙවන විට කරදගොල්ලේ පිහිටි ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලයේ සිසුන් 34 දෙනකු (අධ්‍යයන වර්ෂ 2019-2022 සඳහා) දැ අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව හදාරමින් සිටියි. එම කණ්ඩායම එළඹෙන වර්ෂයේදී පාඨමාලාව අවසන් කිරීමට නියමිතය.

සීප්පුකුලම හා කරදගොල්ල සත්ත්ව පාලන විද්‍යාලයන්හි (2017-2019 කණ්ඩායම) සිසුන් 117 ක් සාර්ථකව සත්ත්ව පාලන ඩිප්ලෝමාව අවසන් කළ අතර ඩිප්ලෝමා ප්‍රධානෝත්සවය 2021 මාර්තු මස පැවැත්විණි.





සීප්පුකුලම හා කරදගොල්ල සත්ත්ව පාලන විද්‍යාලයන්හි ඩිප්ලෝමා ප්‍රධානෝත්සවය - 2021

ආ. තොරතුරු බෙදාහැරීම

දැනට සත්ත්ව පාලන කටයුතුවල නිරතව සිටින්නාවූ කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයින්ට සහ සත්ත්ව පාලන කටයුතුවල නිරතවීමට කැමති පාසල් සිසුන් සහ මහජනතාවට නව තාක්ෂණයන් සම්බන්ධ දැනුම සහ තොරතුරු ලබාදීම සිදුකරන ලදී. සමාලෝචිත කාල සීමාව තුළදී තොරතුරු අඩංගු පොත් 50,431 ක් අලෙවි කිරීමට සහ රූපවාහිනී සහ ගුවන්විදුලි ප්‍රචාරක වැඩසටහන් 54 ක් ඉදිරිපත් කිරීමට හැකි වී ඇත.

සුළු පරිමාණ සත්ත්ව නිෂ්පාදනයෙහි නියැලෙන ගොවීන්ගේ ජීවන තත්වය ඉහල නැංවීමේ අරමුණෙන්, සුළු පරිමාණ සත්ත්ව නිෂ්පාදන ව්‍යවසායකත්ව අත්පොත සම්පාදනය කර සියලු පළාත් වෙත බෙදා හරින ලදී.

2.1.4. නීතිමය කටයුතු සහ සේවාවන්

අ. කුකුළු ගොවිපොළ ලියාපදංචි කිරීම

ප්‍රාදේශිය පශු වෛද්‍ය කාර්යාල මගින් කුකුළු ගොවිපොළ ලියාපදිංචි කිරීම 2021 වර්ෂයේදී ද ක්‍රියාත්මක විය. කුකුළු ගොවිපොළවල් ලියාපදිංචි කිරීමේ වැඩසටහන මගින් බෝවන රෝග මර්දනය කිරීම, තාක්ෂණික සහාය වැඩසටහන් පැවැත්වීම සහ සත්ත්ව නිෂ්පාදනවල ගුණාත්මකභාවය පාලනය කිරීම පහසුවෙන් කරගෙන යාමට හැකි වේ. ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල මගින් 2021 දෙසැම්බර් මස අවසානය වන විට ප්‍රාදේශීය නිදැලි කුකුළු ගොවිපොළවල් 101,253 ක් හා වාණිජ කුකුළු ගොවිපොළවල් 23,426 ක් ලියාපදිංචිකර ඒ සම්බන්ධව විද්‍යුත් දත්ත සමුදායක් ස්ථාපිත කර ඇත.

ආ. සතුන් හඳුනාගැනීමේ වැඩසටහන සහ මධ්‍යම දත්ත සමුදායක් ස්ථාපිත කිරීම

මෙම ව්‍යාපෘතිය යටතේ ක්ෂේත්‍ර ව්‍යාප්ති නිලධාරීන් විසින් ලියාපදිංචි කළ ගොවිපොළ නිරීක්ෂණය කරනු ලබන අතර, ඒවායේ සිටින සතුන්ගේ කන් සලකුණු කිරීම සිදුකරනු ලබයි. සමාලෝචිත කාල සීමාව අවසන් වන විට සතුන් 103,221 දෙනෙකුගේ කන් සලකුණු සවිකර ඇත. ඉතිරි සත්ත්ව ගහනය සහ ඔවුන්ගේ පැටවුන් ඉදිරි වර්ෂවල දී හඳුනා ගැනේ. මෙය සත්ත්ව ගහනය පිළිබඳ නිරවද්‍ය දත්ත පවත්වා ගැනීම, නීති විරෝධී සතුන් ප්‍රවාහනය සහ ඝාතනය වැලැක්වීම, අනාගත කිරි නිෂ්පාදනය පුරෝකථනය හා ඵලදායී නොවන සතුන් ඉවත් කිරීම යනාදියට උපකාර වේ.

2.1.5. පශු මහජන සෞඛ්‍ය සේවාවන්

අ. ආහාර ආරක්ෂණය හා අපනයන කටයුතු පහසුකරණය සඳහා සත්ව ආහාර හා පශු නිෂ්පාදන වල ගුණාත්මකභාවය සහතික කිරීම

2018 වසරේදී ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය හරහා සත්ව ආහාර හා පශු නිෂ්පාදන වල ගුණාත්මකභාවය සහතික කිරීම මගින් අපනයන පහසුකරණය සහ ආහාර ආරක්ෂණය තහවුරු කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ 2021 වර්ෂයේදී පශු පර්යේෂණ ආයතනයේ, සත්ත්ව පෝෂණ අංශයේ පවතින විද්‍යාගාරය වැඩි දියුණුකර ඇත. එමෙන්ම සත්ත්ව ආහාර හා සත්ත්ව නිෂ්පාදන සාම්පල 3,309 ක ගුණාත්මකභාවය විශ්ලේෂණය කර ඇත.

2.2. 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් සහ ව්‍යාපෘති

2.2.1. පශු සම්පත් සංවර්ධනය

2.2.1.1. කිරි ගව ක්ෂේත්‍රය

2021 වසරේදී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන් 2022 වසරේදී ද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

අ. උසස් ආරයේ වැස්සි පැටවුන් සුලභ කිරීමේ ව්‍යාපෘතිය

මේ යටතේ 2022 වසරේදී වැස්සියන් 5,220 ක් ලියාපදිංචි කිරීමට බලාපොරොත්තු වේ.

2.2.2. සත්ත්ව සෞඛ්‍ය වැඩිදියුණු කිරීම

අ. සතුන්ගේ බෝවන රෝග මැඩලීම

ප්‍රතිශක්තිකරණ වැඩසටහන සඳහා අවශ්‍ය වන කුර හා මුඛ, රක්තාශ්‍රව, කාලගාත්‍රා සහ බෘසෙල්ලා එන්නත් පශු පර්යේෂණ ආයතනය මගින් නිෂ්පාදනය කරනු ලබයි. 2022 කාල සීමාව තුළදී ප්‍රතිශක්තිකරණ වැඩසටහන යටතේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිශක්තිකරණ කිරීමට බලාපොරොත්තු වන සතුන් ප්‍රමාණය පහත පරිදි වේ.

එන්නත් වර්ගය	*ප්‍රතිශක්තීකරණය කිරීමට බලාපොරොත්තුවන සතුන් ප්‍රමාණය*
කුර සහ මුඛ රෝග	*800,000*
කාලගාත්‍රා	*136,000*
රක්තාශ්‍රව රෝග	*190,000*

ආ. උසස් තත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම

පශු පර්යේෂණ ආයතනය මගින් 2022 වසර සඳහා සතුන්ගේ බෝවන රෝග ව්‍යාප්තිය වැළැක්වීම සඳහා පහත අයුරින් එන්නත් නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වේ.

එන්නත් වර්ගය	ප්‍රමාණය
කුර හා මුඛ	1,125,581
රක්තාශ්‍රව	385,000
කාලගාත්‍රා	200,000
බෘසෙල්ලා	7,500
රැනිකට්	8,980,000

ඇ. වනජීවී රෝග ආවේක්ෂණ වැඩසටහන

වනජීවී රෝග ආවේක්ෂණය දීප ව්‍යාප්තව පුළුල් කිරීම සඳහා පිහිට වූ සම්බන්ධීකරණ ඒකකය වැඩිදියුණු කිරීම, වනජීවී රෝග හඳුනා ගැනීමට අවශ්‍ය පර්යේෂණ කටයුතු පුළුල් කිරීමේ අරමුණින් ජාතික මට්ටමේ සහ ප්‍රාදේශීය මට්ටමේ රසායනාගාර ශක්තිමත් කිරීම සහ වනජීවී රෝග ආවේක්ෂණයට අදාල පරීක්ෂණ කටයුතු සිදු කිරීම හා නිලධාරීන් සහ පාර්ශවකරුවන් සඳහා හැකියා සංවර්ධනය සිදු කිරීමට මෙමගින් බලාපොරොත්තු වේ.

2.2.3. මානව සම්පත් සංවර්ධනය

අ. හැකියා වර්ධනය, අධ්‍යාපනය සහ පුහුණුව

සීප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලය නැවත ආරම්භ කර, සත්ත්ව පාලනය පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමා මාඨමාලාව සඳහා සිසුන් 64 දෙනෙකු බඳවා ගෙන ඇති අතර දැනට බාහිර කථිකාචාර්යවරුන් මගින් දේශන සහ ප්‍රායෝගික පරීක්ෂණ ඉතා සාර්ථකව සිදු කරනු ලැබේ.

2022 වසරේදී සත්ත්ව පාලන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා කරදගොල්ල සත්ත්ව පාලන විද්‍යාලයට නවක සිසුන් 59 දෙනෙකු බඳවා ගෙන ඇති අතර මේවන විට ඔවුන් පාඨමාලාව සාර්ථකව හදාරමින් සිටියි.



සීප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලය සඳහා නවක සිසුන් බඳවා ගැනීම



සීප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලය නැවත ආරම්භ කිරීමේ උත්සවය

2.2.4. නීතිමය කටයුතු සහ සේවාවන්

අ. සතුන් හඳුනාගැනීමේ වැඩසටහන

සතුන් හඳුනාගැනීම සහ මධ්‍යම දත්ත සමුදායක් ස්ථාපිත කිරීම උදෙසා 2010 වසරේදී ආරම්භ කළ මෙම වැඩසටහන 2022 වසරේදීද අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ ක්ෂේත්‍ර ව්‍යාප්ති නිලධාරීන් විසින් ලියාපදිංචි කළ ගොවිපොළ නිරීක්ෂණය කරනු ලබන අතර, ඒවායේ සිටින සතුන් 150,000 ක් සඳහා 2022 වසරේදී කන් සලකුණු කිරීමට බලාපොරොත්තු වේ. මෙය සත්ත්ව ගහනය පිළිබඳ නිරවද්‍ය දත්ත පවත්වා ගැනීම, නීති විරෝධී සතුන් ප්‍රවාහනය සහ ඝාතනය වැලැක්වීම, අනාගත කිරි නිෂ්පාදනය පුරෝකථනය සහ ඵලදායී නොවන සතුන් ඉවත් කිරීම යනාදියට උපකාරී වේ.

ආ. සත්ත්ව සහ කුකුළු ගොවිපොළ ලියාපදිංචි කිරීම

සත්ත්ව හා කුකුළු ගොවිපොළ ලියාපදිංචි කිරීමේ වැඩසටහන 2022 වසරේදීද අඛණ්ඩව ක්‍රියාත්මක වනු ඇත. මීට අමතරව, ගොවිපොළ ලියාපදිංචි කිරීමේ වැඩසටහන සඳහා ප්‍රාදේශීය මට්ටමේ අන්තර්ජාල පාදක දත්ත සමුදායක් නිර්මාණය කෙරේ.

2.2.5. පශු මහජන සෞඛ්‍ය සේවාවන්

අ. සත්ව ආහාර වල ගුණාත්මකභාවය සහතික කිරීම

අපනයන කටයුතු පහසුකරණය සඳහා ආහාරවල ගුණාත්මකභාවය රසායනාගාර පරීක්ෂණ මගින් තහවුරු කිරීම මෙහි අරමුණ වේ. ප්‍රමිතිගත විශ්ලේෂණ වාර්තා ලබාදීම සඳහා විශ්ලේෂණයන් සිදුකිරීමට අවශ්‍ය සත්ව පෝෂණ පරීක්ෂණාගාරය වැඩිදියුණු කිරීම හා පරීක්ෂණාගාර පහසුකම් වැඩිදියුණු කිරීම අපේක්ෂා කරන අතර දේශීයව සපයා ගත හැකි අමුද්‍රව්‍ය භාවිතයෙන් සත්ත්ව ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීමට අදාල පර්යේෂණ කටයුතු සිදු කරයි.

2.3. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති

2021 වසරේදී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන් හා ව්‍යාපෘති 2022 වසරේදී ද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලැබේ. ඊට අමතරව, නව ව්‍යාපෘති 08 ක් සඳහා ව්‍යාපෘති යෝජනා 2021 වසරේ ජුනි මස අමාත්‍යාංශය වෙත යවා ඇත.

#	*ව්‍යාපෘතිය*	*කාල සීමාව*	*ඇස්තමේන්තු ගත මුදල (රු.මී.)*	*අරමුණු*
01	පරිපූර්ණ ආහාර මිශ්‍රණ (TMR) ලබාදීමේ මධ්‍යස්ථාන පිහිටුවීම මගින් කිරි ගවයින්ගේ කාර්යක්ෂම පෝෂණය තහවුරු කර, කිරි නිෂ්පාදනය වැඩි කිරීම සහ කිරි නිෂ්පාදන වියදම අඩු කිරීම	අවු. 03	208	කිරි ගවයින් සඳහා තුලිත ආහාර ලබාදීම ප්‍රචලිත කිරීම හා ව්‍යවසායී මට්ටමේ තුලිත ගව ආහාර සපයන වෙළඳපොලක් ශ්‍රී ලංකාව තුළ ඇති කිරීම
02	කරඳගොල්ල මධ්‍යම කුකුළු පර්යේෂණ මධ්‍යස්ථානයේ , දිනක් වයසැති කුකුළු පැටවුන් නිෂ්පාදනය කිරීමේ ධාරිතාවය ඉහළ නැංවීම	අවු. 05	123	දිනක් වයසැති ගම් කුකුල් පැටවුන් සඳහා දීපව්‍යාප්තව පවතින අධික ඉල්ලුම සැපයීම සඳහා මධ්‍යම කුකුළු පර්යේෂණ ආයතනය තුළ නිෂ්පාදන හැකියාව ඉහළ නැංවීමට අවශ්‍යතා සපුරා ගැනීම
03	කෘතිම සිංචනය සඳහා ශුක්‍රාණු ලබා ගැනීමට භාවිතා කරන පුං ගවයින්ගේ සුබ සාධනය ඉහළ නැංවීම තුළින් උසස් තත්වයේ ශුක්‍රාණු නිපදවීමේ ධාරිතාවය ඉහළ නැංවීම	අවු. 03	40	ජාතික කෘතිම සිංචන සේවාවේ ඵලදායීතාවය වැඩිකිරීම සඳහා ගුණාත්මකභාවයෙන් යුතු ශුක්‍ර වඩි නිපදවීම හා උසස් ආරයේ ශුක්‍ර දායක පුං ගවයින්ගේ සුභසාධනය ඉහළ නැංවීම
04	පශු පර්යේෂණ ආයතනය තුළ පිහිටුවා ඇති මධ්‍යම පශු විමර්ශන මධ්‍යස්ථානයේ දැනට පවතින රසායනාගාර පහසුකම් සහ ජෛව ආරක්ෂණය වැඩිදියුණු කිරීම තුළින් ජල ජීවී අපනයනය පහසුකරණය කිරීම	අවු. 05	230	ජලජ ජවීන් සහ අනෙකුත් සත්ව නිෂ්පාදන අපනයනය සඳහා සපුරාලිය යුතු නිර්ණායක පරීක්ෂා කිරීම සඳහා මධ්‍යම පශු විමර්ෂණ මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම තුලින් වඩාත් කාර්යක්ෂම සේවාවක් මහජනතාව වෙත ලබාදීම
05	ආර්ථික වැදගත්කමක් ඇති සත්ත්ව රෝග පාලනය කිරීම සහ වළක්වා ගැනීම	අවු. 05	75	අත්‍යාවශ්‍ය ජෛව ආරක්ෂණ ක්‍රම ගොවිපළ තුල ස්ථාපනය කිරීම මගින් වාණිජ සහ අභිජනන (සුළු හා මධ්‍ය පරිමාණ) ගොවිපළ සතුන්ගේ සෞඛ්‍ය මට්ටම ඉහළ නැංවීම හා සතුන්ට වැළඳෙන රෝගකාරක නිසා සිදුවන සත්ව නිෂ්පාදන වල ප්‍රමාණය හා ගුණාත්මකභාවය අඩුවීම වැළැක්වීම
06	උපයෝගීතාවය නංවාලීමට සීප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලය සම්පත් මධ්‍යස්ථානයක් ලෙස වැඩිදියුණු කිරීම	අවු. 03	48.10	ජාතික /වෘත්තීය සුදුසුකම් (පශු සම්පත්) අංශය කෙරෙහි ප්‍රමුඛතාවය ලබාදෙන සම්පත් මධ්‍යස්ථානයක් ලෙස වැඩිදියුණු කිරීම

#	*ව්‍යාපෘතිය*	*කාල සීමාව*	*ඇස්තමේන්තු ගත මුදල (රු.මී.)*	*අරමුණු*
07	ඵලදායී සීමාවාසික පුහුණුවක් ලබාදීම තුළින් නවක පශු වෛද්‍යවරුන්ගේ නිපුණතාවය ඉහළ නැංවීම	අවු. 03	63	ශ්‍රී ලංකාව තුළ පශු වෛද්‍යවරයෙකු වශයෙන් කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා ගැනීමට අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා ගැනීම
08	යහපත් සත්ත්ව පාලන පුරුදු (Good Animal Husbandry Practice/ GAHP) යොදා ගනිමින් සත්ත්ව ගොවිපළවල තිරසාර පැවැත්ම සහ ඉහළ නිෂ්පාදනය තහවුරු කිරීම	අවු. 05	67.90	පශු සම්පත් ගොවිපලවල ආර්ථික හා පාරිසරික තිරසාරභාවය සහ ඵලදායිතාව සහතික කිරීම පශු සම්පත් ගොවිපල වල කසළ කළමනාකරණ පද්ධති වැඩි දියුණු කිරීම

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය හා ඉදිරි දැක්මට අදාළව දෙවන පරිච්ඡේදය මගින් ඉදිරිපත් කර ඇති තොරතුරු සත්‍ය බව සහතික කරමි.

ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ. කොතලාවල
අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ.පෙ. 13, පේරාදෙණිය

3. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එන්

3.1. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහන	තත්‍ය 2021 රු.	තත්‍ය නැවත ගලපන ලද 2020 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		894,670,000	1,030,373,000	ඒසීඒ-3
-	තැන්පතු		21,744,615	8,582,698	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		31,153,251	28,178,026	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		947,567,866	1,067,133,725	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		947,567,866	1,067,133,725	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		-	-	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
525,500,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	492,111,160	509,619,694	
97,800,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	101,269,213	91,095,819	ඒසීඒ-2(ii)
26,500,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	19,092,885	15,455,154	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
649,800,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		612,473,258	616,170,667	
	මූලධන වියදම්				
16,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	8,969,916	21,289,840	
11,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	10,070,128	2,947,881	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
35,000,000	හැකියා වර්ධනය	14	25,740,815	23,588,023	
724,000,000	වෙනත් මූලධන වියදම්	15	346,772,848	433,532,093	
786,000,000	මුළු මූලධන වියදම් (උ)		391,553,707	481,357,837	
	තැන්පතු ගෙවීම්		12,815,133	18,130,124	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		22,039,466	28,241,706	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		34,854,599	46,371,830	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		1,038,881,564	1,143,900,334	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(91,313,698)	(76,766,609)	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(91,313,698)	(76,766,609)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය				ඒසීඒ-3
			(91,313,698)	(76,766,609)	

සී.එම්. ඒකනායක
ප්‍රධාන ගණකාධිකාරී
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2021 රු.	2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	**2,631,975,358**	2,592,330,789
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	**95,267,925**	104,381,710
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**2,727,243,283**	**2,696,712,499**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		**70,780,068**	88,823,336
දේපළ පිරියත හා උපකරණ සංචිතය		**2,631,975,358**	2,592,330,789
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	**24,487,856**	15,558,374
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**2,727,243,283**	**2,696,712,499**

පිටු අංක 01 සිට 37දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 38 සිට 98 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී	ගණන්දීමේ නිලධාරී	ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :ඩී.ඒම්.ඒකනායක
දිනය :2022.02.24	දිනය :2022.02.22	දිනය :2022.02.22

ආර්.එම්.ඩබ්.එස්. සමරදිවාකර
ලේකම්
පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර
ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය
අංක 80/5, බිම් මහල "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ. කොතලාවල
අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ.පෙ. 13, ගැටඹේ
පේරාදෙණිය

ඩී.එම්. ඒකනායක
ප්‍රධාන ගණකාධිකාරී
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ. පෙ. 13
ගැටඹේ - පේරාදෙණිය

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2021	2020
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්		-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර		-
ලාභ		-
ආදායම් නොවන ලැබීම්		-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	93,103,618	81,415,040
අග්‍රිම ලැබීම්	894,670,000	1,030,373,000
අත්තිකාරම් අයකර ගැනීම්	29,991,616	26,811,056
තැන්පතු ලැබීම්	21,744,615	8,582,698
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	1,019,412,849	1,147,181,794
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනාඩි හා මෙහෙයුම් වියදම්	593,360,373	600,715,513
සහනාධාර සහ මාරුකිරීම්	19,092,885	15,455,154
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	5,785,667	5,510,020
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම		2,083,899
අත්තිකාරම් ගෙවීම්	22,041,220	28,110,506
තැන්පතු ගෙවීම්	17,815,133	18,130,124
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	653,115,178	670,005,216
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	386,297,671	477,176,578
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී		-
ලාභාංශ		-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම		-
උපණය අයකර ගැනීම්		-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)		-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	386,297,671	479,260,477
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	386,297,671	479,260,477
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(386,297,671)	(479,260,477)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	(0)	(2,083,899)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්		-
විදේශීය ණය ගැනීම්		-
ප්‍රදානයන් ලැබීම්		-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)		-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්		-
විදේශීය ණය ආපසු ගෙවීම්		-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)		-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)		-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)		(2,083,899)
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය		2,083,899
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය		0

ඩී.එම්. ඒකනායක
ප්‍රධාන ගණකාධිකාරී
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

3

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම් හා මැනීම්

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

7) මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම.

2021 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2020 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදුකර ඇත.

කේ.එම්. ඒකනායක
ප්‍රධාන ගණකාධිකාරී
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ. පෙ. 13
ගැටඹේ · පේරාදෙණිය

3.5 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය



ඒඑස් -2

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව ව්‍යය පිළිබඳ සාරාංශය

වියදම් ශීර්ෂ අංකය : 292

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම :

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

රු.

මධ්‍යම ඇස්තමේන්තුගත වසරක් පදනි වැඩසටහන් අංකය	වියදම්කළ නම	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.අ.මු. 66/69 මගින් කිරීම් ** (3)	මුළු ඉදිරි ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	මුළු වියදම් (5)	ඉදිරි ප්‍රතිපාදන ඉතිරිය /(අක්මවීම්) (6)=(4)-(5)
වැඩසටහන (1)	(1) ප්‍රධාන වර්ගය	649,800,000		(6,000,000)	643,800,000	612,473,258	31,326,742
	(2) ප්‍රාන්ත	67,000,000		(5,000,000)	62,000,000	49,627,827	12,372,173
	උප එකතුව	716,800,000	-	(11,000,000)	705,800,000	662,101,085	43,698,915
වැඩසටහන (2)	(1) ප්‍රධාන වර්ගය						
	(2) ප්‍රාන්ත	719,000,000		(230,000,000)	489,000,000	341,925,880	147,074,120
	උප එකතුව	719,000,000	-	(230,000,000)	489,000,000	341,925,880	147,074,120
	මුළු එකතුව	1,435,800,000	-	(241,000,000)	1,194,800,000	1,004,026,965	190,773,035

සටහන:** අමාත්‍ය මණ්ඩල තීරණ අංක 21/1596/304/134 හා 2021.09.03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වසර අවසන දැ ප්‍රතිපාදන පිළිබඳ විස්තර පිටු අංක 20 හි ඉදිරිපත් කර ඇත.

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගිණුම්කාරිය/
අධ්‍යක්ෂ (මූල්‍ය) /කොමසාරිස් (මූල්‍ය)
දිනය :2022.02. ෭෭

ඩී.ඩබ්.වික්‍රමාරච්චි
ප්‍රධාන ගණකාධිකාරී
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ. අංක. 13
ගංවර්ක - පේරාදෙණිය

3.6. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2021.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැඟිලි හා ව්‍යුහයන්	-	912,811,813.56	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	421,091,557.96	-	-
9153	ඉඩම්	-	1,298,071,986.95	-	-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } කේඩීඒ/සී/ඩීඒපීඑච්/ඒ/2021/81 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2022 මැයි 31 දින

ගණන්දීමේ නිලධාරී

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර්31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වූ මෙම වාර්තාව නිකුත් කරනු ලබන අතර ගණන්දීමේ නිලධාරී විසින් ජාතික විගණන පනතේ 39 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මා වෙත වාර්තා කළ යුතුය. මෙම වාර්තාවේ පෙන්වා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකිවීමේ හේතු තිබෙනම් ඒ බවද මා වෙත දන්වා එවිය යුතුය.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) පුනරාවර්තන වියදම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
වැය විෂයයන් 8 ක වියදම් සාරාංශය (එස්ඒ - 10) අනුව 2021 දෙසැම්බර් 31 දිනට දක්වා තිබුණු ඉතිරිවීම් රු.291,725,501 ක් වූ නමුත් දෙපාර්තමේන්තුවේ වැය ලෙජරය අනුව එය රු.50,725,501 ක් වූයෙන් රු.241,000,000 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. (යොමුව:-කේඩීඒ/සී/ඩීඒපීඑච්/ඒ/2021/81)	නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු වීම.	අමාත්‍ය මණ්ඩල තීරණ දැනුම් දීම අනුව පවරා දෙන ලද ප්‍රතිපාදනයන් බව දන්වා ඇත.

1.6.1 (ඒ)

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

(ආ) මූලධන වියදම්

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
ශීර්ෂ 292-2 සංවර්ධන වැඩ සටහනේ ප්‍රතිපාදන ඉතිරිවීම්වලට හේතු දැක්වීමේ ප්‍රකාශනයේ, ඒසිඒ 2(ii) ආකෘතියේ සඳහන් ඉතිරිවීම් ශේෂය රු.50,136,000 ක් වුවද භාණ්ඩාගාර සටහන් පත්‍රිකා එස්ඒ - 10 ආකෘතියේ වියදම් සාරාංශයෙහි සඳහන් ඉතිරිවීම් ශේෂය රු.262,623,000 ක් වූයෙන් රු.212,487,000 කින් නොසැසඳුණි.	නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු වීම.	වෙනස පරිගණක ගත කිරීමේදී සිදු වූ වෙනසක් බවත් ඉදිරියේදී මෙවැනි අතපසුවීම් අවම කිරීමටත් කටයුතු කරන බව දන්වා ඇත.

1.6.1 (ආ)

(යොමුව:-කේඩීඒ/සී/ඩීඒපීඑච්/ඒ/2021/81)

(ඇ) දේපල පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
ඉකුත් වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ, එස්ඒ - 82 ආකෘතියේ ඇතුළත් වත්කම් විෂයයන් 6 කට අදාළ ශේෂ එකතුව රු.1,305,751,333 ක් වුවද ඒවා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස ඉදිරියට ගෙන ඒමේදී එම ශේෂ එකතුව රු.1,390,750,863 ක් ලෙස දැක්වීම නිසා රු.84,999,530 ක නොසැසඳීමක් නිරීක්ෂණය වූ අතර ආරම්භක ශේෂ ඉදිරියට ගෙන ඒමේදී පැවති වෙනසට හේතුද පැහැදිලි නොකෙරුණි.	දෙපාර්තමේන්තු පොත් නිවැරදිව යාවත්කාලීන කළ යුතු වීම.	අදාළ යෙදවුම් පද්ධතියේ දෝෂයක් බැවින් එය භාණ්ඩාගාර ගිණුම් දෙපාර්තමේන්තුව විසින් 2021 ජනවාරි 01 දිනට නිවැරදි කර ඇති බැවින් මෙම වෙනස සිදුව තිබෙන බව දන්වා ඇත.

1.6.2

(යොමුව:-කේඩීඒ/සී/ඩීඒපීඑච්/ඒ/2021/81)

(ඇ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
විෂය අංක 29201 දරන රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය හා භාණ්ඩාගාර පොත් අනුව ශේෂය අතර 2015 වර්ෂයේ සිට රු.100,125 ක වෙනසක් පැවති නමුත් එම වෙනස නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	භාණ්ඩාගාර පොත් අනුව දෙපාර්තමේන්තු පොත් සැසඳීමට කටයුතු කළ යුතු වීම.	ණය ශේෂය නිරවුල් කිරීමට ප්‍රමාණවත් තොරතුරු නොමැති වීම මත තවදුරටත් මෙම ශේෂය පවත්වාගෙන යාමට සිදු වූ බවත් එම ශේෂ පොත්වලින් ලියා හැරීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ඉල්ලා ඇති බව දන්වා ඇත. 1.6.3

(යොමුව:-කේඩීඒ/සී/ඩීඒපීඑච්/ඒ/2022/93)

(ඉ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(i)	මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක සටහන් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළ රු.51,382,223 ක් වූ බැරකම් ලේඛනයක සටහන් කර නොතිබුණි.	මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතු වීම.	වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදන ඉතිරිය හා වියදම් සටහන් කර විසර්ජන වැය ලෙජරය තුලනය කරන බව දන්වා ඇත. 1.6.4

(යොමුව:-කේඩීඒ/සී/ඩීඒපීඑච්/ඒ/2021/81)

(ii)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 4.3.4 ඡේදය ප්‍රකාරව එක් එක් නිවාස ශ්‍රේණිය සඳහා වෙන වෙනම පොරොත්තු ලේඛන නඩත්තු කළ යුතු වුවත් එසේ කරනොතිබුණි. (යොමුව : - කේඩීඒ/සි/ඩීඒපීඑච්/බී/2021/40)	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව පොරොත්තු ලේඛන නඩත්තු කළ යුතු වීම.	ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත.

(ඊ) ගණන්දීමේ නිලධාරි විසින් සිදුකළ යුතු සහතික වීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරීන් විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම කළ යුතුව තිබුණත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම
දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳ කලින් කල සමාලෝචනය කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	අභ්‍යන්තර පාලන පද්ධතිය සඵලදායී ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය වෙනස්කම් පිළිබඳ කාලීන සමාලෝචනය විගණන කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කරන බව දන්වා ඇත.

(ඇ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	වටිනාකම	නිරීක්ෂණය අනුකූල නොවීම	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
	රු.			
(I) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය				
XV පරිච්ඡේදයේ 4 වගන්තිය	17,299,301	අධ්‍යන, අභ්‍යාස හෝ රාජකාරී කටයුතු සඳහා විදේශ ගත වූ නිලධාරීන් 09 දෙනෙකු නැවත සේවයට වාර්තා කර නොතිබීම හේතුවෙන් අනිවාර්ය සේවා කාලයක් සේවය කිරීම සඳහා එළඹී ගිවිසුම කඩ කිරීම නිසා එම නිලධාරීන්ගෙන් අය විය යුතු දඩ මුදල අය කර ගෙන නොතිබුණි. (යොමුව:- කේඩීජ්/සී/ඩීජිපීඑව්/බී/2021/82)	ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම.	අයකර ගැනීම සඳහා ගත හැකි පියවර ගෙන තිබෙන බවත් එම උත්සාහයන් තවදුරටත් කරගෙන යන බව දන්වා ඇත.
(II) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය				
මුදල් රෙගුලාසි 383	5,871,344	ගනුදෙනුකරුවන් විසින් දෙපාර්තමේන්තු ගිණුමට සෘජුවම ගෙවන ලද මුදල් හඳුනාගෙන ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වුවද 2021 ජූලි 01 දින	මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	පිළිගන්නා බවත් ලැබීම් සියල්ල හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත.

			සිට දෙසැම්බර් 31 දක්වා හඳුනානොගත් ලැබීම් හඳුනාගෙන ශිණුම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. (යොමුව:- කේඩීඒ/සී/ඩීඒපීඑච්/ඒ/2021/81)		
(III)	2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති xviii පරිච්ඡේදයේ 193 වගන්තිය	-	සෑම රජයේ නිලධාරියෙක්ම සේවා කාලය අවුරුදු 5 ක් සම්පූර්ණ වූ විට ස්ථාන මාරුවීම්වලට යටත් විය යුතු වුවත් වසර 15 ක් එකම ස්ථානයේ සේවය කිරීමෙන් පසුව වුවද ස්ථාන මාරුවීමක් නොකළ නිලධාරීන් 105ක් සිටින බව නිරීක්ෂණය වූ අතර එයින් නිලධාරීන් 33 ක් වසර 25 ට වැඩි කාලයක් එකම ස්ථානයේ සේවය කරමින් සිටි නිලධාරීන් විය. (යොමුව : - කේඩීඒ/සී/ඩීඒපීඑච්/ඒබී/2021/57)	කාර්ය පරිපාටික රීති සංග්‍රහය අනුව කටයුතු කළ යුතු වීම.	පිළිතුරු ලබා දී නැත.
(IV)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	-	සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාලසීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන	චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන දැවීම පරීක්ෂා කළ යුතු වීම.	ඉදිරියේදී එම පරීක්ෂාවන් ඉක්මණින් අවසන් කිරීමට අදාළ අංශ වෙත උපදෙස් ලබාදුන් බව දන්වා ඇත.

			අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් සිදු කළ යුතු වුවද වාහන 15 ක එලෙස ඉන්ධන පරීක්ෂාව කර නොතිබුණි. (යොමුව : කේඩීඒ/සී/ඩීඒපීඑච/ඒබී/2021/56)		
(V)	2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	-	වාහනවල සුන්බුන් වටිනාකම හෙවත් පිරිවැය අඟය පිරිහීමට ලක්වීම තුළින් රජයට අවාසියක් සිදුවීම වැළැක්වීම සඳහා ආයතනවල අබලන් වූ වාහන භාවිතයෙන් ඉවත් කිරීමට කඩිනමින් පියවර ගත යුතු වුවද වාහන 9 ක් සම්බන්ධයෙන් එසේ පියවර ගැනීම වසර 5 කට වැඩි කාලයක් ප්‍රමාද වී තිබුණි. (යොමුව : කේඩීඒ/සී/ඩීඒපීඑච/ඒබී/2021/56)	චක්‍ර ලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	පිළිගන්නා බවත්, ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව අපහරණ කටයුතු සිදු කරන බව දන්වා ඇත.
(VI)	2015 දෙසැම්බර් 11 දිනැති අංක: PFD/04/08/01/59 /පොදු දරන රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ ලිපිය	33,072,921	රාජ්‍ය ආයතනවලින් මහජනතාවට සපයනු ලබන සේවා සඳහා අයකරන ගාස්තු වසර 03 කට වරක් සියයට 15 ක උපරිමයකට යටත්ව සංශෝධනය කළ යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් අවසන් වරට	රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	ඉදිරියේදී නිරෝධායන ගාස්තු සංශෝධනය කිරීමට කටයුතු කරන බව දන්වා ඇත.

නිරෝධායන ගාස්තු සංශෝධනය කර තිබුණේ 2010 වර්ෂයේදී බැවින් 2016 වර්ෂයේ සිට 2020 දක්වා කාලය තුළදී අය කරන ලද නිරෝධායන ගාස්තු සංශෝධනය කිරීමකින් තොරව අය කර තිබුණි.

(යොමුව :කේඩීජ්/සි/ඩීජ්පී එව්/ඒබී/2022/86)

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	නිර්දේශය	දෙපාර්තමේන්තුවේ නිලධාරීගේ අදහස් දැක්වීම
වැය විෂයයන් 9 ක් සඳහා වෙන්කර තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.62,962,000 ක් උපයෝජනය නොකර ඉතිරිකර තිබුණු අතර එම ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 සිට සියයට 89 දක්වා පරතරයක පැවතුණි. (යොමුව:-කේඩීජ්/සි/ඩීජ්පීඑව්/ජ්/2021/81)	තාත්ත්විකව හා නිවැරදිව ඇස්තමේන්තු සකස් කළ යුතු වීම.	පිළිගන්නා බව දන්වා ඇත.

2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අතැනි බිල්පත් වටිනාකම රු.51,382,223 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වුවද නියැදි පරීක්ෂාවට අනුව රු.3,713,753 ක බැරකම් අඩුවෙන් දක්වා තිබුණි.	මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙළ කළ යුතු වීම.	මුදල් අංශය වෙත ලද සියළුම වවුචර්පත් බැරකම් ලෙස දක්වා ඇති බව දන්වා ඇත.
(ආ)	වැය විෂයයන් 2 ක ඉතිරි ප්‍රතිපාදනයේ එකතුව රු.407,757ක් වූ නමුත් එම වැය විෂයයන් යටතේ රු.1,905,746 ක බැරකම්වලට එළඹ සිටි බැවින් එම වැය විෂයයන් යටතේ රු.1,497,989 ක ප්‍රතිපාදන ඉක්මවා බැදීම් ඇතිකර තිබුණි. (යොමුව:-කේඩීඒ/සී/ඩීඒපීඑච්/ඒ/2021/81)	පවතින ප්‍රතිපාදනය අනුව කටයුතු කළ යුතු වීම.	ප්‍රතිපාදන ඉක්මවා බැදීම් ඇති කරගෙන නොමැති බව දන්වා ඇත.

2.3 තැන්පතු

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
2016 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 දක්වා වූ කාලය තුළදී කරන ලද ඉදිකිරීම් කර්මාන්තවල බිල්පත්වලින් අඩුකර ගන්නා ලද රැඳවුම් මුදල් රු.4,054,297 ක් 2021 දෙසැම්බර් 31 දිනට තැන්පත් ලෙජරයේ රඳවාගෙන තිබෙන අතර අදාළ ඉදිකිරීම් කර්මාන්තවල අඩුපාඩු තිබෙනම්	ඉදිකිරීම් කර්මාන්තවල අඩුපාඩු තිබේ නම් ඒවා කොන්ත්‍රාත්කරු ලවා නිවැරදි කර ඉතිරි රැඳවුම් මුදල නිදහස් කිරීම	ඉදිරියේදී නිරවුල් කිරීමට නොහැකි ශේෂයන් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරන බව දන්වා ඇත.

කොන්ත්‍රාත්කරු ලවා එම අඩුපාඩු සම්පූර්ණ කරගෙන නිදහස් කිරීමට කටයුතු කර නොතිබුණි.

(යොමුව:-කේඩීඒ/සී/ඩීඒපීඑච්/ඒ/2021/81)

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 සැලැසුම් කිරීම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
කරඳගොල්ල සත්ත්ව පාලන විද්‍යාලයේ 2019/2021 අධ්‍යන වර්ෂය සඳහා පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව NVQ 5,6 මට්ටමට ලබා ගැනීමට අපේක්ෂිතව සිසුන් 67 දෙනෙකු ලියාපදිංචි කර නිබුණද අධ්‍යන වර්ෂය අතරතුරදී සිසුන් 34 දෙනෙකු හෙවත් සියයට 51 ක ප්‍රමාණයක් පාඨමාලාව අත් හැර ගොස් තිබුණි. සිසුන් පාඨමාලා අතරමහදී අතහැර යාම හේතුවෙන් පාඨමාලා හැදෑරීමට වෙනත් අයෙකුට තිබෙන අවස්ථාව මහ හැරී යාමද, අතහැර ගිය සිසුන් සඳහා දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් වීමද සිදුවන බවත් මේ හේතුවෙන් සත්ත්ව පාලන ක්ෂේත්‍රයේ සංවර්ධනය කෙරෙහි අහිතකර ලෙස එය බල පෑ හැකි බවත් නිරීක්ෂණය විය.	දැනට තිබෙන සම්පත් උපරිම භාවිතයට ගැනීමට පියවර ගත යුතුය.	පිළිගන්නා බව දන්වා ඇත.

(යොමුව : - කේඩීඒ/සී/ඩීඒපීඑච්/ඒඩී/2021/46)

3.2 කාර්යයන් ඉටු නොකිරීම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අතිරේක ලේකම්ගේ (පාලන හා මූල්‍ය) අංක PSC/EST/7/4/2/2012 හා 2017 ජූනි 28 දිනැති ලිපියට අනුව පර්යේෂණ සහකාර විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වෙනම ස්ථාන මාරු පරිපාටියක් සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතු බව එම කොමිෂන් සභා තීරණය පරිදි වැඩි දුරටත් දක්වා තිබුණද 2021 දෙසැම්බර් 31 වන විටත් එම කාර්යය සිදු කර නොතිබුණි. (යොමුව : - කේඩීඒ/සී/ඩීඒපීඑච්/ඒබී/2021/57)	කොමිෂන් සභාවේ තීරණය ක්‍රියාත්මක කළ යුතු වීම.	පිළිතුරු ලබා දී නොමැත. 3.1.2

3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
කෘතිම සිංචන මධ්‍යස්ථානයේ පසුගිය වසර 3 හි ගව ශුක්‍ර වඩි නිෂ්පාදන වාර්ෂික ඉලක්කය 325000 ක් වුවද 2018,2019 සහ 2020 වර්ෂයන්හි නිෂ්පාදනය පිළිවෙලින් 279536,188118 සහ 200255 ක් වූයෙන් අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වී තිබුණි. (යොමුව : - කේඩීඒ/සී/ඩීඒපීඑච්/ඒබී/2021/45)	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් ඉලක්කයන් ළඟා කර ගැනීමට පියවර ගත යුතු වීම.	පිළිගන්නා බව දන්වා ඇත. 2.7.3 (ii)

3.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
පොල්ගොල්ල සත්ත්ව විෂාණු රසායනාගාරයේ වැඩි දියුණු කිරීම් හා අලුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.3,273,873 ක ටෙන්ඩර් මුදලකට 2018 අගෝස්තු 24 දින තෝරාගත් කොන්ත්‍රාත්කරුවෙකු වෙත 2018 දෙසැම්බර් 29 දිනට පෙර අවසන් කිරීම සඳහා ගිවිසුම්ගතව කොන්ත්‍රාත්තුව පිරි නමා තිබුණි. කොන්ත්‍රාත්තුවේ අළුත්වැඩියා කිරීම් අවසන් නොකර කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව අත් හැර දමා තිබියදී 2020 අගෝස්තු 11 දින කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කර තිබුණි. කෙසේ වුවද රසායනාගාරයේ අලුත්වැඩියාවන් නිසි පරිදි සිදු නොකිරීම හේතුවෙන් නියමිත අයුරින් ජීවාණුහරණ ක්‍රියාවලියක් සිදු කර ගැනීමට නොහැකි වීමත් රසායනාගාරයේ පර්යේෂණ කටයුතු, එන්නත් සාර නිෂ්පාදන කටයුතු බලවත් අපහසුතා සහිතව සිදු කරන බවත් නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂයේදී ද නැවත අලුත්වැඩියා කිරීම් ආරම්භ කර නොතිබුණි. (යොමුව : - කේඩීඒ/ඕ/ඩීඒපීඑච්/ඒබී/2021/47)	ව්‍යාපෘති සැලසුම් කළ පරිදි නිම කිරීමට කටයුතු කළ යුතු වීම.	පිළිගන්නා බවත් ඉදිරියේදී නැවත අළුත්වැඩියා කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා ඇත.

3.1.3 (අ)

3.5 වාර්ෂික කාර්යසාධන වාර්තාව

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
2021 අගෝස්තු 28 දිනැති අංක 2/2021 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් පරිදි වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙළ කළ යුතුව තිබුණු අතර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය අනුව එය වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. එහෙත් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. (යොමුව : - කේඩීඒ/සී/ඩීඒපීඑච්/ඒ/2021/81)	චක්‍රලේඛ උපදෙස් හා ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම.	නියමිත දිනට ඉදිරිපත් කරන ලෙස අදාළ අංශ වෙත උපදෙස් ලබාදුන් බව දන්වා ඇත. 3.1.4

3.6 ප්‍රසම්පාදනයන්

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	2020 දෙසැම්බර් 30 දින අංක 924 සහ 2021 අප්‍රේල් 21 දින අංක 367 දරන වවුචර මඟින් පරිගනක යන්ත්‍ර 27 ක් හා යූපීඑස් 27 ක් මිලදී ගැනීම සඳහා රු.3,281,175 ක් ගෙවා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය.	✓	

(i)	පරිගණක යන්ත්‍ර සහ යුපීඑස් 27 ක අවශ්‍යතාවය කලින් හඳුනාගෙන තිබීම හේතුවෙන් එම පරිගණක යන්ත්‍ර හා යුපීඑස් 27 එකවර මිලදී ගැනීම සඳහා රු.3,281,175 ක් වටිනාකමක් වන බැවින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටු අධිකාරි සීමාව වන රු.මිලියන 25 ට අඩු ප්‍රධාන කොන්ත්‍රාත් භාණ්ඩ හා සේවා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු නිර්දේශ යටතේ මිලදී ගැනීම් සිදු නොකර ප්‍රසම්පාදන කමිටු අධිකාරි සීමාව රු.මිලියන 03 ට අඩු දෙපාර්තමේන්තු සුළු ප්‍රසම්පාදන කමිටු නිර්දේශය යටතේ අවස්ථා 02 කදී මෙම පරිගණක යන්ත්‍ර හා යුපීඑස් 27 මිලදී ගැනීම සිදු කර තිබුණි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු වීම.	එක් එක් අංශයන්හි ඉල්ලීම අනුව පරිගනක මිලදී ගැනීම සිදු කළ බව දන්වා ඇත.
(ii)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 (ආ) ප්‍රකාරව රු.500,000 ක් ඉක්මවන භාණ්ඩ හෝ සේවා සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම් ක්‍රියාත්මක කළ යුතු වුවද රු.3,281,175 ක් වටිනා පරිගණක හා යුපීඑස් මිලදී ගැනීම් සඳහා එසේ ලිඛිත ගිවිසුම්වලට එළඹ නොතිබුණි. (යොමුව: කේඩීජ්/සි/ඩීජ්පීඑව/කී/2021/42)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු වීම.	ඉදිරියේදී සිදු කරන ප්‍රසම්පාදන කටයුතු සඳහා ගිවිසුම්වලට එළඹීම සම්බන්ධයෙන් අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදුන් බව දන්වා ඇත.
(ආ)	අභිජනන කටයුතු සඳහා 2019 අප්‍රේල් මාසයේදී ඕස්ට්‍රේලියාවෙන් එළුවන් 100 ක් ආනයනය කර තිබුණු අතර එම එළුවන් අතරින් පිරිමි සතුන් 05 ක් සහ ගැහැණු සතුන් 16 ක් ද වශයෙන් එකතුව එළුවන් 21 ක් 2021 දෙසැම්බර් 31 දිනට මිය ගොස් තිබුණු අතර මිය ගිය එළුවන්ගේ වටිනාකම රු.8,036,275 ක් හෙවත් මූලික ආයෝජනයෙන් සියයට 23 ක් වන අතර	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු වීම.	පිළිගන්නා බව දන්වා ඇත.

අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට පෙර මිය යාම තුළින් මෙම සතුන් සඳහා එතෙක් දරන ලද ආනයනික හා නඩත්තු වියදම් ඵලදායී නොවන බවද නිරීක්ෂණය විය. තවද එළුවන් ආනයනය කිරීම සඳහා ප්‍රසම්පාදන මණ්ඩලය 2017 වර්ෂයේදී අනුමත කර තිබුණු නමුත් ආනයනය කර තිබුණේ 2019 වර්ෂයේදී බැවින් විනිමය අනුපාතයේ වෙනස්වීම මත රු.2,311,760ක් අමතරව ගෙවීමට සිදුව තිබුණි.

(යොමුව: කේඩීජ/ඕ/ඩීජපීඵව/ජඩ්/2022/91)

3.7 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	කරඳගොල්ල සත්ත්ව පාලන විද්‍යාලයේ පශු සම්පත් තාක්ෂණයපිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව NVQ 5,6 මට්ටමට උසස් කිරීම සඳහා සම්පූර්ණ විය යුතු අවශ්‍යතා යටතේ ගිනි නිවීමේ උපකරණ රු.675,800 ක් ගෙවා 2020 ඔක්තෝබර් 16 දින එම උපකරණ මිලදී ගෙන තිබුණි. එම ගිනි නිවීමේ උපකරණ සවි කිරීම සඳහා පද්ධතියට අයත් රු.213,500 ක් වටිනා මීටර් 30 කම්ප්ලීට් හෝස් රීල් 7 ක් (Complete Hose Reel)ස්ථාපිත කිරීමට කටයුතු නොකර ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි.	වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු වීම.	2022 වර්ෂයේදී සවි කිරීමට සැලසුම් කර ඇති බව දන්වා ඇත.

(ආ)	කුණ්ඩසාලේ කෘතීම සිංචන මධ්‍යස්ථානය සතුව රජයේ නිවාස 16ක් පවතින අතර නිවාස 4 ක් කාර්යමණ්ඩල පුරප්පාඩු හේතුවෙන් භාවිතයෙන් තොරව නිශ්කාර්යව පැවතුණු අතර මෙම නිවාස සියල්ල අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවතුණි. (යොමුව:-කේඩීඒ/සී/ඩීඒපීඑච/ඒබී/2021/45)	පවතින සම්පත් උපරිම ලෙස භාවිතයට ගැනීමට පියවර ගත යුතුවීම.	පිළිගන්නා බවත් ඉදිරියේදී අළුත්වැඩියා කටයුතු කිරීමට සැලසුම් කර ඇති බව දන්වා ඇත. 3.3.2 (අ)
(ඇ)	ඉඹුලන්දණ්ඩ එළු අභිජනන මධ්‍යස්ථානය පිහිටි ඉඩම අක්කර 37ක් වන නමුත් එයින් අක්කර 15 ක පමණ භූමියක් නිසි භාවිතයෙන් තොරව පැවතිණි. (යොමුව:-කේඩීඒ/සී/ඩීඒපීඑච/ඒබී/2022/85)	වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු වීම.	සත්ත්ව ආහාර සඳහා කොස් පැළ සිටුවීමට සැලසුම් කර ඇති බව දන්වා ඇත. 3.3.3
(ඇ)	කරඳගොල්ල කුකුල් පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටි ඉඩම අක්කර 25ක් වන නමුත් එයින් අක්කර 06 ක පමණ භූමියක් නිසි භාවිතයෙන් තොරව පැවතුණි.	වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු වීම.	තෘණ වගා කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බව දන්වා ඇත. 3.3.4 (අ)
(ඉ)	කරඳගොල්ල කුකුල් පර්යේෂණ මධ්‍යස්ථානයේ 2015 වර්ෂයේ එවකට පැවති තාරා කොටුව රු.1,562,000 ක් වැය කර ගව ගාලක් බවට පරිවර්තනය කර තිබුණු නමුත් එය 2021ජූනි වන විටත් භාවිතයෙන් තොරව පැවතුණි. . (යොමුව:-කේඩීඒ/සී/ඩීඒපීඑච/ඒබී/2021/48)	පර්යේෂණ මධ්‍යස්ථානය සතු වත්කම්වලින් උපරිම ප්‍රයෝජන අත් කර දීමට පියවර ගත යුතු වීම.	ඉදිරියේදී මෙම ඒකකය ප්‍රයෝජනවත් ලෙස භාවිතයේ යෙදවීම සඳහා අවදානය යොමු කර තිබෙන බව දන්වා ඇත. 3.3.4 (අ)

3.8 රජයේ නිලධාරීන් ඇප තැබීම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ මුදල්, ආදායම්, මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාර සිටීම එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ නිලධාරීන්ද, රජයේ ගිණුමට අදාළ වවුචර් සහතික කරන වෙක්පත් අත්සන් කරන අය ද ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවද සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 95 දෙනෙකු වටිනාකම රු.1,380,528 ක් වූ ඇප තබා නොතිබුණි.	මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	මාසික වැටුපෙන් වාරික 10 කින් අය කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වා ඇත.

(යොමුව:- සීඑල්පීඑල්/කේඩී/එච්/ඩීඒපීඑච්/බී/2021/26)

3.9 පාඩු හා හානි

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
අවස්ථා 3 කට අදාළ රු.518,776 ක් වූ අලාභ තවදුරටත් අය කර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත් හැර දැමීමට තිබුණි. එයින් රු.430,000 කට අදාළ අලාභ වසර 30 කට පෙර සිදුව තිබුණු අලාභයකි.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වීම.	මුදල් රෙගුලාසි පුකාරව අවශ්‍ය කටයුතු කරමින් පවතින බව දන්වා ඇත.

(යොමුව:කේඩීඒ/සී/ඩීඒපීඑච්/ඒ/2021/81)

3.10 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන්කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	1998 වර්ෂයේදී කුකුල් වසුරිය එන්නත් සාර වඩි 1500000 ක් ආනයනය කර තිබුණු අතර එයින් වඩි 637300 ක් පමණක් ක්ෂේත්‍රය තුළ භාවිතයට ගෙන තිබුණි. ඒ අනුව එන්නත් වඩි 862700 ක් භාවිතයට නොගෙන තිබීම නිසා 2000 වර්ෂයේදී කල් ඉකුත් වී තිබුණු අතර එහි වටිනාකම රු.948,970 ක් විය. මෙම අලාභය 2021 වර්ෂයේදී පොත්වලින් කපා හැර තිබුණි. (යොමුව:- කේඩීඒ/සී/ඩීඒපීඑච/ඒබී/2021/58)	අවශ්‍යතාවය පදනම් කරගෙන වඩා තාත්ත්වික ලෙස ප්‍රසම්පාදන සැලසුම සකස් කළ යුතු වීම.	පිළිගන්නා බවත්, ඉල්ලීම අඩු වීම හේතුවෙන් ඉතිරිය ගබඩා කර තිබියදී කල් ඉකුත් වූ බවත් ඉදිරියේදී ක්ෂේත්‍ර අවශ්‍යතාවය මැනවින් හඳුනාගෙන සපයා ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. 3.6 (අ)
(ආ)	රාජ්‍ය කළමනාකරණ සේවයේ නිලධාරිනියකට 2019 ජූනි සිට උපලේඛනගත නිවාසයක පදිංචිය සඳහා වෙන් කර දී තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දිනට නිවාස කුලිය රු.201,305, ක් අඩුවෙන් අයකර ගෙන තිබුණි. (යොමුව:- කේඩීඒ/සී/ඩීඒපීඑච/බී/2021/40(i))	ආයතන සංග්‍රහය අනුව කටයුතු කළ යුතු වීම.	අදාළ නිලධාරිනියගෙන් හිඟ මුදල අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වා ඇත. 3.6 (ආ)

4. තිරසර සංවර්ධන අරමුණු ළඟාකරගැනීම

පහත කරුණු නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
දෙපාර්තමේන්තුව තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" පිළිබඳව දැනුවත්ව දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට අදාළ තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මෙන්ම එම ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගෙන තිබුණ නමුත් තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා සුදුසු දත්ත පදනමක් සැලසුම් කර නොතිබුණි.	තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්කයන් පිළිබඳ දැනුවත් වී එම අරමුණු ළඟා කර ගැනීමට සැලසුම් කළ යුතු වීම.	ක්‍රියාකාරී සැලැස්මට අදාළ ක්‍රියාකාරකම් වෙත නියමිත කාලයේදී ළඟා වී නොමැති නම් ඒවා නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා ඇත.

4 - (අ)

5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම තුළ තනතුරු 28 ක පුරප්පාඩු 61 ක් පැවති අතර එම පුරප්පාඩු අතර අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරක්ද, අධ්‍යක්ෂ තනතුරු 6 ක්ද, ප්‍රධාන විද්‍යාඥ තනතුරු 6 ක්ද, පශු විමර්ශන නිලධාරි තනතුරු 7 ක්ද විය.	දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය පදනම් කරගෙනපුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම.	පිළිතුරු ලබා දී නොමැත.

5 (අ) i

(ආ)	දෙපාර්තමේන්තුව සඳහා අනුමත කර තිබුණේ පශු වෛද්‍ය නිලධාරී තනතුරු 61 ක් පමණක් වුවද 66 ක් අනුයුක්ත කර තිබූ බැවින් පශු වෛද්‍යවරු 5 ක් අතිරික්තව පැවතුණි.	අනුමත කාර්ය මණ්ඩලය තුළ කටයුතු කළ යුතු වීම.	පිළිතුරු ලබා දී නොමැත.
(ඇ)	ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 103 ක් පැවති බැවින් ක්ෂේත්‍ර කාර්යයන් කරගෙන යාමේදී අපහසුතා පැන නැඟී තිබුණි.	දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය පදනම් කරගෙන පුරප්පාඩු පිරවිය යුතු වීම.	පිළිතුරු ලබා දී නොමැත.

එස්.එම්.විජේරත්න
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත්:- 1. මුදල් විෂයභාර අමාත්‍ය - මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

2. විෂයභාර අමාත්‍ය - පශු සම්පත්, ගොවිපල ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර, ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

4. කාර්යසාධන දර්ශක

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

අනු අංකය	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	75%-89%	50%-74%
01	දේශීය කිරි නිෂ්පාදනය වැඩිවීමේ ප්‍රමාණය (ලීටර් මිලියන/ වසරකට)	✓		
02	වාර්ෂික ඒකපුද්ගල බිත්තර පරිභෝජනය වැඩිවීමේ ප්‍රමාණය (බිත්තර ගණන/ වසරකට)	✓		
03	වාර්ෂික ඒකපුද්ගල කුකුළු මස් පරිභෝජනය වැඩිවීමේ ප්‍රමාණය (කි.ග්‍රෑම් වසරකට)	✓		
04	දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය වැඩිවීමේ ප්‍රමාණය			✓

**අදාල ව්‍යාපෘතිවල ප්‍රතිලාභීන්ගේ නියැදියන්ගෙන් ලබාගත් තොරතුරු මත මෙම ගණනය කර ඇත*

5. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1. හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය/අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49	50%-74%	75%-100%
(i) සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගීබව අවසන් කිරීම	වසර 2021 වන විට දේශීය කිරි නිෂ්පාදනය ලීටර මිලියන 493 දක්වා ඉහල නැංවීම	දේශීය කිරි නිෂ්පාදනය වැඩිවීමේ ප්‍රමාණය (ලීටර් මිලියන/ වසරකට)			✓
(ii) සාගින්න නැතිකර ආහාර සුරක්ෂිතතාවය හා යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම	වසර 2021 වන විට වාර්ෂික ඒකපුද්ගල බිත්තර පරිභෝජනය 130 දක්වා ඉහල නැංවීම	වාර්ෂික ඒකපුද්ගල බිත්තර පරිභෝජනය වැඩිවීමේ ප්‍රමාණය (බිත්තර ගණන/ වසරකට)			✓
	වසර 2021 වන විට වාර්ෂික ඒකපුද්ගල කුකුල් මස් පරිභෝජනය කිලෝ ග්‍රෑම් 10 දක්වා ඉහල නැංවීම	වාර්ෂික ඒකපුද්ගල කුකුල් මස් පරිභෝජනය වැඩිවීමේ ප්‍රමාණය (කුකුල් මස් කිලෝ ග්‍රෑම් /වසරකට)			✓
(iii) ආර්ථික වර්ධන වේගය ඉහළ නැංවීම	කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ සත්ත්ව නිෂ්පාදන අංශයේ වර්ධන වේගය 5% දක්වා ඉහළ නැංවීම	දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය 1% - 1.5% කින් වැඩිවීමේ ප්‍රමාණය		✓	

5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍ය ප්‍රමාණයට ක්‍රමානුකූලව නොලැබීම සහ අවශ්‍ය කාර්ය මණ්ඩල හිඟකම නිසා තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී බාධා මතුවේ.

6. මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	195	139	56
තෘතීයික	22	13	09
ද්විතීක	342	303	39
ප්‍රාථමික	395	292	103

6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ පශු සම්පත් සංවර්ධනය පිළිබඳව වගකීම දරණ ප්‍රධාන රජයේ ආයතනයක් වේ. වර්තමානයේ මෙම දෙපාර්තමේන්තුව පශු සම්පත් ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

මෙම දෙපාර්තමේන්තුව රට තුළ සත්ත්ව රෝග පැතිරීම වළක්වාලීම, මැඩපැවැත්වීම, පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු, තාක්ෂණික නායකත්වය සැපයීම සහ සත්ත්ව අභිජනන කටයුතු සඳහා විශේෂඥ උපදෙස් හා සහාය සේවාවන් සැපයීම සම්බන්ධව නීත්‍යානුකූල බලය පැවරී ඇති ජාතික ආයතනයද වේ. මුළු දිවයිනම ආවරණය වන පරිදි සිදුකරනු ලබන වෙනත් ප්‍රධාන කටයුතු අතර සත්ත්ව පාලනය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම, එම කර්මාන්තය නගාසිටුවීමට අදාළ ව්‍යාපෘති සැකසීම, ආර්ථික ඇගයීම් සහ විශේෂ සංවර්ධන වැඩසටහන්ද ඇතුළත්වේ. පශු සම්පත් ක්ෂේත්‍රයේ සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් අදාළ නීති සම්පාදනය කර ක්‍රියාත්මක කරනු ලැබේ. පළාත් සභා පිහිටුවීමත් සමඟ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර මට්ටමේ කටයුතු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු නවය (09) වෙතට පැවරී ඇත.

පශු වෛද්‍ය නිලධාරීන් විසින් මෙහෙයවනු ලබන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාකාරී ඒකකයන්ය. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක වන දිවයිනේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම පාහේ පිහිටුවා තිබෙන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල 337 මගින් බිම් මට්ටමේ සිට සියළුම පශු සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

නිරෝගිමත් සත්ත්ව ගහණයක් හා වැඩි නිෂ්පාදන ඵලදායීතාවයකින් යුතු ආහාර සුරක්ෂිත තාවයක් හා ආහාරයන්හි සෞඛ්‍ය ආරක්ෂිතභාවය තහවුරු කිරීම් ක්ෂේත්‍රයේ පශු සම්පත් ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනයක් ලබා දීම උදෙසා තාක්ෂණික මඟ පෙන්වීම හා සහාය ලබා දීමේදී අදාල කාර්යභාරයන් මැනවින් ඉටු කිරීමට අවශ්‍ය කාර්ය මණ්ඩල හිඟකම නිසා ආයතනික ඉලක්ක හා අරමුණු ලගා කර ගැනීමේදී බාධා මතුවේ.

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	*පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව*	*වැඩසටහනේ කාල සීමාව*	*සමස්ත ආයෝජනය*		*වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)*	*නිමවුම/ ලබාගත් දැනුම*
			දේශීය	*විදේශීය*		
සාමාන්‍ය පරිපාලන හා මූල්‍ය රෙගුලාසි	35	දින 03	27,091.00		දේශීය	සාමාන්‍ය පරිපාලන හා මූල්‍ය රෙගුලාසි
ගවයන්ගේ හමේ ගැටිති රෝගය (Lumpy Skin Disease)	200	දින 01	3,540.00		දේශීය සහභාගීත්වය හා විදේශීය සම්පත්දායකත්වය	Lumpy Skin Disease පිළබඳ දැනුම
සත්ත්ව සෞඛ්‍ය	50	දින 03	36,395.00		දේශීය	සත්ත්ව සෞඛ්‍ය පිළබඳ දැනුම
නායකත්වය, ගැටළු විසඳීම සහ තීරණ ගැනීම	21	දින 02	21,752.00		දේශීය	නායකත්වය, ගැටළු විසඳීම සහ තීරණ ගැනීම පිළිබඳව
පරිසර හිතකාමී පශු සම්පත් ගොවිතැන	25	දින 01	18,202.00		දේශීය	පරිසර හිතකාමී පශු සම්පත් ගොවිතැන
පූර්ව සේවාස්ථ පුහුණුව - රසායනාගාර උප සහායකයින්	11	දින 01	12,660.00		දේශීය	රසායනාගාර උප සහායකයින් සඳහා සාමාන්‍ය පරිපාලන හා මූල්‍ය රෙගුලාසි පිළබඳ දැනුම
මහජන සම්බන්ධතා සහ විනය	34	දින 01	29,250.00		දේශීය	මහජන සම්බන්ධතා සහ විනය
ආයතනික කළමනාකරණය	28	දින 03	31,896.00		දේශීය	ආයතනික කළමනාකරණය
පශු මහජන සෞඛ්‍ය	32	දින 03	30,158.00		දේශීය	පශු මහජන සෞඛ්‍ය
කුකුළු ආහාර සැකසීම	29	දින 02	56,931.00		දේශීය	කුකුළු ආහාර සැකසීම
ගබඩා කළමනාකරණය	30	දින 01	25,964.00		දේශීය	ගබඩා කළමනාකරණය
පූර්ව සේවාස්ථ පුහුණුව - සංවර්ධන නිලධාරී	22	දින 02	37,447.00		දේශීය	පූර්ව සේවාස්ථ පුහුණුව - සංවර්ධන නිලධාරී
සෞඛ්‍ය සම්පන්න කිරි නිෂ්පාදනය සහ කිරි තත්ත්ව පරීක්ෂාව	13	දින 02	27,474.00		දේශීය	සෞඛ්‍ය සම්පන්න කිරි නිෂ්පාදනය සහ කිරි තත්ත්ව පරීක්ෂාව

වැඩසටහනේ නම	*පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව*	*වැඩසටහනේ කාල සීමාව*	*සමස්ත ආයෝජනය*		*වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)*	*නිමවුම/ ලබාගත් දැනුම*
			දේශීය	*විදේශීය*		
පශු අණ පනත් හා නීති අංශයේ කාර්යයන්	40	දින 03	19,453.00		දේශීය	පශු නියාමන කටයුතු
පරිපාලනය සහ මුල්‍ය රෙගුලාසි	15	දින 03	20,400.00		දේශීය	පරිපාලනය සහ මුල්‍ය රෙගුලාසි
ප්‍රධාන කාර්යාල නිලධාරීන් සඳහා SLT යෙදුම භාවිතා කිරීමට පුහුණුව	19	දින 01	2,400.00		දේශීය	SLT යෙදුම භාවිතා කිරීමට පුහුණුව
කිරි ගොවිපල සඳහා නව තාක්ෂණය	82	දින 03	2,400.00		දේශීය සහභාගීත්වය හා විදේශීය සම්පත්දායකත්වය	කිරි ගොවිපල සඳහා නව තාක්ෂණය භාවිතා කිරීම
සත්ත්ව පෝෂණය සහ කළමනාකරණය	41	දින 03	2,400.00		දේශීය	සත්ත්ව පෝෂණය සහ කළමනාකරණය
පූර්ව සේවාස්ථ පුහුණුව - නවක පශු වෛද්‍යවරු	35	දින 39	255,344.00		දේශීය	සාමාන්‍ය පරිපාලන හා මූල්‍ය රෙගුලාසි
ගව පරපෝෂිත රෝග පිළිබඳ සම්මන්ත්‍රණය	32	දින 01	2,400.00		දේශීය සහභාගීත්වය හා විදේශීය සම්පත්දායකත්වය	ගව පරපෝෂිත රෝග
සත්ත්ව අභිජනනය	62	දින 03	2,400.00		දේශීය	සත්ත්ව අභිජනනය
පශු වෛද්‍ය ආර්ථික සහ සංඛ්‍යා ලේඛන	57	දින 03	13,800.00		දේශීය	පශු වෛද්‍ය ආර්ථික සහ සංඛ්‍යා ලේඛන
කාර්යාල කළමනාකරණය	25	දින 01	8,955.00		දේශීය	ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ පටිපාටි රීති
ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ පටිපාටි රීති	32	දින 01	25,856.00		දේශීය	කාර්යාල කළමනාකරණ පද්ධති
කාර්යාල කළමනාකරණ පද්ධති	40	දින 01	15,299.00		දේශීය	කාර්යාල කළමනාකරණ පද්ධති

7. අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ /ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම්(වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	මුදල් රෙගුලාසි ප්‍රකාරව පිළියෙල කිරීම අවශ්‍ය නොවේ.	මුදල් රෙගුලාසි ප්‍රකාරව පිළියෙල කිරීම අවශ්‍ය නොවේ.
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	මුදල් රෙගුලාසි ප්‍රකාරව පිළියෙල කිරීම අවශ්‍ය නොවේ.	මුදල් රෙගුලාසි ප්‍රකාරව පිළියෙල කිරීම අවශ්‍ය නොවේ.
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.6	වෙනත්			
2	**පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම(මු.රෙ. 445)**	අනුකූල වේ		
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන /පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	භානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව,රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූලවේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD)නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මූදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA 1-2019 අනුව,වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම			
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	අංශවලින් පිළිතුරු ලබාදීමට කාලයක් ගැනීම	සිහිකැඳවීම් යවමින් පසු විපරම් කිරීම
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4)උප වගන්තිය ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3)ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017දරණ වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.4	වාර්ෂික භාන්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත,ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදුකිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විකණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06ට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මූ.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහන වල ඉන්දන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක්	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	ඇතුළත නිරවුල් කර තිබීම			
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම්**			
13.1	කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මූ.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම , එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මූ.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල නොවේ	විශේෂ හේතු මත ස්ථාන මාරු වීම් ලබා දීමේදී හා තාවකාලික අනුයුක්ත කිරීම් වලදී කාර්ය මණ්ඩලය ඉක්මවා යාම් සිදු වී ඇත.	ඉදිරියේදී නියමිත ස්ථාන මාරු පටිපාටි ක්‍රමවේද නිසි ආකාරයෙන් පිලිපැදීම තුලින් වලක්වා ගැනීමට අපේක්ෂා කෙරේ.
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පලකිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ	පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කෙරෙමින් පවති.	නිසි කාලරාමුවකින් යුතුව කටයුතු කිරීම මගින් සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිත වේ
18.2	එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි	අනුකූල නොවේ	කටයුතු සිදු	ඉදිරියේදී සිදුවන ප්‍රමාද

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදන කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇඟයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම		කෙරෙමින් පවතී.	දෝෂ වළක්වා ගැනීමට කටයුතු කෙරේ.
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කෙරෙමින් පවතී.	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කඩිනමින් සිදුකිරීමට කටයුතු කෙරේ.
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 ට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	එම	එම
19.3	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	එම	එම
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කොට තිබීම	අනුකූල නොවේ	එම	එම
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වාදී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූලවේ		